2022 ජනවාරි • 238 කලාපය

# රණවිරුවා



## සිත් නිවෙන මෙත් වැඩෙන පින් බිමක අසිරිය

බර නොමදී රටට වැලි ඇටයක් තරම
උර මත දරා දෙස රැස සුරකින වරම
අරගල මැදින් රැකගත් පින් බිම උරුම
කුරගල සෑය දුටුවද දිස්වන අරුම

- [illegible]

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.

# මාතෘභූමියට ආශිර්වාද එක්කිරීමේ වාර්ෂික “ජය පිරිත්” සජ්ඣායනාව







ආරක්ෂක අමාත්‍යාංශයේ ආරාධනයකට අනුව මහානායක සහ අනුනායක හිමිවරුන් ප්‍රමුඛ දිවයිනේ නන් දෙසින් වැඩමවා වදාළ දහසකට අධික මහා සංඝරත්නය ඉකුත් ජනවාරි 26 වන දින සන්ධ්‍යාවේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී "ජය පිරිත්" සජ්ඣායනා කර සියලු රට වැසියන්ටත් රටේ සමෘද්ධිය සහ යහපැවැත්ම උදෙසාත් ආශිර්වාද එක් කළහ.

එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් සහභාගි වූ අතර ජනාධිපති ආර්යා අයෝමා රාජපක්ෂ මැතිනිය, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, නාවික සහ ගුවන් හමුදාධිපතිවරු, ආරක්ෂක අමාත්‍යාංශ සේවා වනිතා ඒකකයේ සභාපතිනි, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි මෙන්ම නාවික හා ගුවන් හමුදා සේවා වනිතා ඒකක සභාපතිනියන් ද එක්ව සිටියහ.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ පාලන සමයේ ආරක්ෂක ලේකම් ධූරය හෙබවූ වත්මන් ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව මෙම වාර්ෂික පිරිත් සජ්ඣායනාව 2008 වසරේදී ආරම්භ කෙරිණි.



# කූරගල අසදිසි ශාක්‍ය සුගත මහා සෑයේ පූජා වස්තු තැන්පත් කෙරේ

කූරගල ඓතිහාසික පුදබිමෙහි පිහිටා ඇති අසදිසි ශාක්‍ය සුගත මහා සෑයේ පූජා වස්තු සහ පුරාවස්තු තැන්පත් කිරීමේ පුණ්‍යෝත්සවය පසුගිය ජනවාරි 16 වන දින මධ්‍යහ්නයේදී අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් සහ ජනාධිපති ආර්යා අයෝමා රාජපක්ෂ මැතිනියගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණි.



මෙම අවස්ථාවට කූරගල විහාරස්ථානයේ හා නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ විහාරාධිපති පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන හිමිපාණන් සමඟින් අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ද එක්වූහ.

ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවෙන පුරාවිද්‍යාත්මක ඉතිහාසයකට උරුමකම් කියන භූමියක පිහිටා ඇති බෞද්ධ ආගමික ස්ථානයක් වන කූරගල අසදිසි ශාක්‍ය සුගත මහා සෑය ඉදිකිරීමේ කටයුතු පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන නාහිමිපාණන්ගේ මූලිකත්වයෙන් යුද්ධ හමුදා හටපිරිස් ප්‍රමුඛ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහ බැතිමතුන්ගේ නොමසුරු දායකත්වය මත ක්‍රියාවට නැංවේ. එවකට ආරක්ෂක ලේකම් ධූරය හෙබවූ වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ එවකට ජනාධිපති ලෙස කටයුතු කළ වත්මන් අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ සක්‍රිය දායකත්වය මත 2015 වර්ෂයට පෙර ආරම්භ කළ "යළි පිබිදෙන කූරගල" (කූරගල පුනර්ජීවනය) තුළින් මෙම ව්‍යාපෘතියේ ආරම්භය සනිටුහන් විය.





# කුරගල පින්බිම යළි පිබිදුණු වගයි

යළි පුනර්ජීවය ලද කුරගල අසදිසි ශාක්‍ය සුගත මහා සෑයේ පූජා වස්තු සහ පුරාවස්තු තැන්පත් කිරීම වෙනුවෙන් පසුගිය ජනවාරි 16 වන දින සන්ධ්‍යාවේ පැවති උත්සවයට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ප්‍රධානත්වය දැරූහ. කුරගල විහාරස්ථානයේ හා නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ විහාරාධිපති හිමිපාණන්ගේ මූලිකත්වයෙන් සැදැහැවත් බෞද්ධයින්, යුද්ධ හමුදා භටපිරිස් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ කැපවීම මත දිගුකලක් පුරාවට කිසිවකුගේ අවධානයට ලක් නොවී ගරාවැටෙමින් පැවති මෙම බලංගොඩ, කල්තොට ප්‍රදේශයේ පිහිටි කුරගල ලෙන් විහාරයේ ශ්‍රී විභූතිය හා ඓතිහාසික උරුමය යළි පණගැන්වීමට ලැබීම බෞද්ධ සැමගේ අමන්දානන්දයට හේතු වන්නකි.

බලංගොඩ හෝමෝ සේපියන්ස් ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැවත එන කල්තොට, කුරගල ආරණ්‍ය සේනාසනයේ පුරාවිද්‍යා භූමිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යුද්ධ හමුදා භටපිරිස්හි ශ්‍රම දායකත්වය, තාක්ෂණික හා ඉංජිනේරු දැනුම සහ විශේෂඥතාවය මත සාක්ෂාත් කරගැනීමට හැකිවිය.

කුරගල විහාරස්ථානයේ හා නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ විහාරාධිපති පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන හිමිපාණන් විසින් මීට මාස 8 කට පමණ පෙර යුද්ධ හමුදාධිපති වෙත සිදුකළ ආරාධනයකට අනුව යුද්ධ හමුදා භටපිරිස් විසින් මෙම විහාරස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සිය දායකත්වය දැක්වූහ.

මෙම අවස්ථාව තවත් වර්ණවත් කරමින් ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානයක් මඟින් ගුවනින් පුෂ්ප වර්ෂා පූජාවක් ද සිදුකරන ලදී. ත්‍රෛනිකායික හිමිවරු, මැති ඇමතිවරු, රාජ්‍ය නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් මෙම පුණ්‍යවන්ත කටයුත්තට එක්වූහ.



# ඓතිහාසික දීඝවාපි පුදබිමේ නව ධාතු මන්දිරය සඟසතු කෙරේ



බුදුරජාණන් වහන්සේගේ වැඩමවීමෙන් පූජනීයත්වයට පත් සොලොස්මස්ථානයන්ගෙන් එකක් වන නැගෙනහිර පළාතේ පිහිටි පෞරාණික "දීඝවාපිය" විහාරස්ථානය මේ වනවිට "දීඝවාපී අරුණ භාරකාර අරමුදල" යටතේ නව මුහුණුවරකින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරමින් පවතී.

එම පුදබිම තුළ අභිනවයෙන් ඉදිකරනු ලැබූ නව ධාතු මන්දිරය ආරක්ෂක ලේකම් මෙන්ම පුරාවිද්‍යා උරුමයන් කළමනාකරණ ජනාධිපති කාර්ය සාධක බලකායේ නැගෙනහිර පළාත් සභාපති ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දුරුතු පුර පසළොස්වක පොහෝ දින පැවති පූජෝත්සවයකදී විවෘත කරන ලදී. බැතිමතුන්ගේ වන්දනාමාන කටයුතු සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබූ සර්වඥ ධාතූන් වහන්සේලා මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ අභිනවයෙන් ඉදිකළ "ධාතු මන්දිරය" තුළ තැන්පත් කිරීම ද එහිදී සිදුකෙරිණ.

මෙම අවස්ථාව සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් හා අම්පාර හිටපු දිසාපති ඩී.එම්.එල්. බණ්ඩාරනායක, අම්පාර දිස්ත්‍රික් ලේකම්, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ඇතුළු තවත් ආරාධිතයන් රැසක් එක්වූහ.





# ආරක්ෂක සේවා විද්‍යාලයේ 15 වන සංවත්සරය සැමරේ



කොළඹ 02 පිහිටි ආරක්ෂක සේවා විද්‍යාලයේ 15 වන සංවත්සරය නිමිත්තෙන් එම විද්‍යාලයේ සිසු සිසුවියන්, ගුරුභවතුන් සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සියලු රට වැසියන්ට ආශිර්වාද එක්කරමින් ඉකුත් ජනවාරි 19 වන දින සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පැවැත්විණ.

එම විද්‍යාලයේ විදුහල්පතිගේ ආරාධනයකට අනුව එම අවස්ථාවට ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ නාවික හමුදාධිපති සහභාගි වූහ.



# යුද්ධ හමුදා රෝහලට දැඩි සත්කාර ඇඳන් පරිත්‍යාගයක්



දිවංගත බ්‍රිගේඩියර් සුදත් උදයසේන වෙත පින් අනුමෝදන් කිරීමේ අරමුණින් ඇමෙරිකා එක්සත් ජනපදයේ පදිංචි කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන කේමින්ද ජයවර්ධන මහතා විසින් කොළඹ යුද්ධ හමුදා රෝහලේ ප්‍රයෝජනය සඳහා දැඩි සත්කාර ඇඳන් 4 ක් ප්‍රදානය කරන ලදී.

විදේශගත ශ්‍රී ලාංකිකයකු වන කේමින්ද ජයවර්ධන මහතා විසින් ඉකුත් ජනවාරි 12 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවී ඇමරිකානු ඩොලර් 2000 ක පමණ වටිනාකමකින් යුත් මෙම ඇඳන් 4 සංකේතාත්මකව භාර දුන්නේය.

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරල් ඩබ්ලිව්ජ්එස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ විසින් සිය පාසල් මිතුරකු වූ දිවංගත බ්‍රිගේඩියර් සුදත් උදයසේන වෙත පින් අනුමෝදන් කරමින් සිදුකරනු ලැබූ මෙම පරිත්‍යාග වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී.

# වෙඩිකරුවන්ට සම්මාන පිරිනැමේ







"ස්නයිපර්වරුන්ගේ නිවහන" ලෙසින් ප්‍රචලිත දියතලාව ප්‍රගුණ වෙඩිකරු පුහුණු පාසල වෙතින් සංවිධානය කරනු ලැබූ "යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික වෙඩි තැබීමේ තරඟාවලිය - 2021" හි සම්මාන ප්‍රදානෝත්සවය ඉකුත් ජනවාරි 29 වන දින දියතලාව ප්‍රගුණ හා සැඟවුණු වෙඩිකරු පුහුණු පාසලේදී පැවැත්විණ.

මෙම අවස්ථාවට එම පුහුණු පාසලේ සේනාවිධායක හා ශ්‍රී ලංකා සුළු අවි සංගමයේ සභාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ටීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ආරාධනයකට අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගි විය.

යුද්ධ හමුදා "ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" ට සමගාමීව සංවිධානය කරනු ලැබූ මෙම තරඟාවලිය විවෘත, සේවා සහ ආධුනික ලෙස කාණ්ඩ තුනක් යටතේ පැවැත්විණි.

මේ සඳහා සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් තරඟකරුවන් 340 කට අධික සංඛ්‍යාවක් තරඟ වැදුණු අතර, එහිදී විවෘත කාණ්ඩයේ ශූරතාවය ගජබා රෙජිමේන්තු වෙඩික්කරුවන්ද දෙවන සහ තෙවන ස්ථාන පිළිවෙළින් ගැමුණු හේවා බලකායේ සහ කමාන්ඩෝ රෙජිමේන්තුවේ වෙඩික්කරුවන් විසින් ද හිමිකරගත්හ. සේවා කාණ්ඩයේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා වෙඩික්කරුවන් හිමිකර ගනිද්දී එහි දෙවන ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා රෙජිමේන්තු වෙඩික්කරුවන් හිමිකර ගත්හ. එමෙන්ම ආධුනික කාණ්ඩයේ ශූරතාවය ගැමුණු හේවා රෙජිමේන්තු වෙඩික්කරුවන් විසින් දිනා ගනිද්දී එහි දෙවන සහ තෙවන ස්ථාන පිළිවෙළින් ගජබා සහ කමාන්ඩෝ රෙජිමේන්තු වෙඩික්කරුවන් දිනාගත්හ.

# සුළු අවි පුහුණු සමාකෘතියක් දියතලාවේ





දියතලාව ප්‍රගුණ වෙඩිකරු පුහුණු පාසල වෙත ඉන්දීය යුද්ධ හමුදාව වෙතින් පරිත්‍යාග කළ සුළු අවි පුහුණු සමාකෘතිය *(Simulator)* ස්ථානගත කොට පුහුණු ස්ථානයක් පිහිටුවීමේ උත්සවයක් ඉකුත් ජනවාරි 29 වන දින පස්වරුවේ එම පුහුණු පාසලේදී පැවැත්විණ. පුහුණු පාසලේ සේනාවිධායක හා ශ්‍රී ලංකා සුළු අවි සංගමයේ සභාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ටීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගි විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කෙරෙහි පවතින අවබෝධය සහ ද්විපාර්ශ්වික සහයෝගීතාවය තවදුරටත් තහවුරු කරමින් ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී ජෙනරාල් මනෝජ් මුකුන්ද් නාරාවන පසුගිය දා ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාරය අතරතුර ඉන්දියාවේ නිෂ්පාදිත මෙම සමාකෘතිය පරිත්‍යාග කරන ලදී. එමෙන්ම, එම සුළු අවි පුහුණු සමාකෘතිය පුහුණු පාසල් පරිශ්‍රයේ වෙනම ස්ථානයක ස්ථානගත කිරීමේ අවශ්‍යතාවය ද එතුමන් විසින් පෙන්වා දුන්නේය.



# රණවිරු දැතින් නව නිවසක්

රට දැය වෙනුවෙන් දිවිපිදූ ලුතිනන් කර්නල් ඩබ්ලිව්ඩී උදය ප්‍රියන්ත ද සිල්වා අනුස්මරණ මිතුරු සංසදයේ සාමාජිකයින්ගේ අනුග්‍රහය ඇතිව යුද්ධ හමුදා ඉංජිනේරු සේවා බලකායේ තාක්‍ෂණික දැනුම යොදාගනිමින් අම්බලන්ගොඩ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුලක් වෙනුවෙන් ඉදිකළ නව නිවසක් ඉකුත් දෙසැම්බර් 31 වන දින ආගමික වතාවත් මධ්‍යයේ චාරිත්‍රානුකූලව විවෘත කරන ලදී.



දරුවන් පස්දෙනකුගෙන් යුත් පවුලේ සාමාජිකයින් වෙනුවෙන් අභිනවයෙන් ඉදිකළ මෙම නව නිවස අයිතිකරුවන් වෙත භාරදීමේ අවස්ථාවට ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සූම් තාක්‍ෂණය ඔස්සේ (*zoom technology*) සම්බන්ධ විය. වර්ෂ 1997 මැයි මස 16 දින "ජය සිකුරු" මෙහෙයුම අතරතුර නැදුන්කේනි ප්‍රදේශයේදී දිවිපිදූ ගජබා රෙජිමේන්තුවේ ලුතිනන් කර්නල් ඩබ්ලිව්ඩී උදය ප්‍රියන්ත ද සිල්වා මාතෘභූමියේ ස්වෛරීත්වය ආරක්‍ෂා කිරීම උදෙසා සිය ජීවිතය පූජා කිරීමට ප්‍රථම එම ඒකකයේ අණදෙන නිලධාරී ලෙස කටයුතු කළ තමා සමඟ එදින දිවා ආහාරය පවා ගත් බව ද එහිදී යුද්ධ හමුදාධිපති සිහිපත් කළේය.

පියල් ලමාහේවා මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් "ලුතිනන් කර්නල් ඩබ්ලිව්ඩී උදය ප්‍රියන්ත ද සිල්වා අනුස්මරණ මිතුරු සංසදයේ" මූල්‍ය අනුග්‍රාහකත්වය මත ඉදිකළ මෙම නිවසට රුපියල් මිලියන හතක මුදලක් වැයවී තිබිණ. 61 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් මත 14 වන ගැමුණු හේවා බලඇණියේ භටපිරිස් ඊට ශ්‍රමදායකත්වය ලබාදුන්හ. මෙම නිවස විවෘත කිරීමේ උත්සවයට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද සහභාගි විය.

# දැනුම ප්‍රවර්ධනයට සම්මන්ත්‍රණයක්





ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ සංකල්පයකට අනුව "සමකාලීන ලෝකයේ හමුදා නායකත්වය, රණශූරයකුගේ සිට අවශ්‍ය මිතුරකු දක්වා පරිනාමය වීම" යන තේමාව ඔස්සේ ත්‍රිවිධ හමුදාවන්හි මධ්‍යම ශ්‍රේණියේ නිලධාරීන් වෙනුවෙන් සංවිධානය කෙරුණු එක්දින සම්මන්ත්‍රණයක් ඉකුත් ජනවාරි 13 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.

"සන්නද්ධ හමුදා" මධ්‍යම ශ්‍රේණියේ නිලධාරීන්ගේ නායකත්ව ලක්ෂණ, සාරධර්ම සහ ගුණාංග ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පැවැත්වෙන මෙම සම්මන්ත්‍රණය තුළින් නිලධාරියකු තම දැනුම හා කුසලතාවන්ගෙන් පරිපූර්ණ වීම සඳහා සිදුකළ යුතු කාර්යභාරය, තීරණ ගැනීමට සහ එම ගුණාංගයන් තුළින් අන් අය වෙනුවෙන් උපදෙස් ලබාදීමට ඇති හැකියාව පිළිබඳ දැනුවත් කෙරේ. නායකයකු ලෙස ත්‍රිවිධ හමුදා සේවයට එක් වී එළදායී මෙහෙවරක නිරත වන යුද, නාවික හා ගුවන් හමුදාවන්හි මධ්‍යම ශ්‍රේණියේ නිලධාරීන් 300 දෙනකු මෙම සම්මන්ත්‍රණය සඳහා එක්වූහ.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහභාගි විය.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කළ යුද්ධ හමුදාධිපති සිය පිළිගැනීමේ කථාව සිදුකරමින් සන්නද්ධ හමුදා සාමාජිකයන් ප්‍රශස්ත මෙහෙයුම් හැකියාවන්ගෙන් යුක්ත බව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමේ සහ ඒකාබද්ධ පුහුණුවීම් පැවැත්වීමේ වැදගත්කම පිළිබඳ අවධාරණය කළේය. මෙම අවස්ථාව සඳහා කීර්තිමත් විද්වතුන් රැසක්ද ත්‍රිවිධ හමුදා ජ්‍යේෂ්ඨ නිලධාරීන් හා විශ්‍රාමික යුද්ධ හමුදාධිපති ජෙනරාල් දයා රත්නායක ද සහභාගී වූහ.

# සුහද හමුවක්



ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ සභාපති ධූරයට නැවත තේරී පත් වූ සුරේෂ් සුබ්‍රමනියම් මහතා ඉකුත් ජනවාරි 21 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබලිවඩබලිව්වී ආර්ඩබලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය.

මෙම හමුවේදී, යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ නව සභාපති වෙත සිය සුබපැතුම් එක් කරමින් ඔලිම්පික් ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිරතව සිටින ක්‍රීඩකයින් සහ නවක අපේක්ෂකයින් සඳහා මලල ක්‍රීඩා ක්ෂේත්‍රය තවදුරටත් වැඩිදියුණු කිරීම පිළිබඳව සාකච්ඡා කළේය.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස යුද, නාවික හා ගුවන් හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව්වලට සහභාගී කරවීම සඳහා දක්වන දායකත්වය වෙනුවෙන් සුබ්‍රමනියම් මහතා ද යුද්ධ හමුදාධිපතිතුමන් වෙත සිය ස්තුතිය පුද කළේය.

# නව වසරේ වැඩ ඇරඹුම සුබ මොහොතින්








එළැඹි 2022 නව වසරේ රාජකාරි ඇරඹීම නිමිත්තෙන් සංවිධානය කෙරුණු උත්සව දෙකක් යුද්ධ හමුදා මූලස්ථානයේදී හා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේදී පැවැත්වූයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ප්‍රධානත්වයෙනි. එහිදී මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ පැවති උත්සවයට සුවිශේෂත්වයක් එක් කරමින් යුද්ධ හමුදාධිපති අතින් එහි සේවය කරන සිවිල් සේවකයින්ට නව වසර වෙනුවෙන් ත්‍යාග පාර්සල් ද පිරිනැමිණ.









# බංගලාදේශ නාවික හමුදා ප්‍රධානීට බුහුමන් පිදේ



බංගලාදේශ නාවික හමුදා ප්‍රධානී අද්මිරාල් එම්. ෂහීන් ඉක්බාල් *(Admiral M' Shaheen Iqbal)* ඉකුත් දෙසැම්බර් 19 වන දින සන්ධ්‍යාවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය. එහිදී හමුදා සම්ප්‍රදායානුකූලව ඔහු වෙත හිමිවූයේ ගෞරවනීය පිළිගැනීමකි.

යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවැති මෙම සුහද හමුවේදී සමුද්‍ර ගැටලු, නාවික කටයුතු ඇතුළු ද්විපාර්ශ්වික වශයෙන් වැදගත් කරුණු කිහිපයක් පිළිබඳව දෙදෙනා සුහදව අදහස් හුවමාරු කර ගත්හ.

කලාපයේ සැබෑ අසල්වැසියකු ලෙස බංගලාදේශ නාවික හමුදා ප්‍රධානී ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවට ලබාදෙන සහයෝගය පිළිබඳව යුද්ධ හමුදාධිපති එහිදී එතුමන් වෙත සිය ප්‍රසාදය පළ කළේය.



# සන්නද්ධ බුද්ධි බළකායේ 29 වැනි සැමරුම









සන්නද්ධ බුද්ධි බළකායේ 29 වැනි සංවත්සර සැමරුම සහ එම බළකායේ යුද්ධයෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන් ගුණානුස්මරණය කිරීම පසුගිය ජනවාරි 21 වන දින අම්බලන්ගොඩ කරන්දෙණියේ පිහිටි සන්නද්ධ බුද්ධි බළකා මූලස්ථානයේදී පැවැත්විණ. එම බළකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ටීඑස් සලේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය. හමුදා සම්ප්‍රදායානුකූලව රෙජිමේන්තුවෙන් ලද බුහුමන් මධ්‍යයේ යුද්ධ හමුදාධිපති වෙත එහිදී ලැබුණේ ගෞරවනීය පිළිගැනීමකි. දිවයින පුරා ස්ථාපිත සන්නද්ධ බුද්ධි බළකායට අයත් සියලු බලඇණි නියෝජනය කරමින් නිලධාරීන් සහ සෙසුනිලයන් 300 දෙනකුට අධික පිරිසක් ඇමතීමටද එහිදී යුද්ධ හමුදාධිපති කටයුතු කළේය.

ඉන් අනතුරුව, එම රෙජිමේන්තුවෙහි නව ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙන මූලස්ථාන පරිශ්‍රයේ නිරීක්ෂණ චාරිකාවකද නිරත වූ යුද්ධ හමුදාධිපති එහිදී එම කටයුතුවල නිරතව සිටි ඉංජිනේරු භටපිරිස් සමඟ අදහස් හුවමාරු කර ගැනීමටද අමතක නොකළේය.

සන්නද්ධ බුද්ධි බළකා රණවිරු ස්මාරකය අභියස පැවති "ස්මාරක පෙළපාලිය" සඳහාද යුද්ධ හමුදාධිපති සමගින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ඇතුළු සම්භාවනීය අමුත්තන් එක්වූහ. එහිදී සන්නද්ධ හමුදා බුද්ධි බළකායේ මෙහෙයුම් වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන් 69 දෙනකු සිහිකරමින් ඔවුන් වෙත පුෂ්පෝපහාර දැක්වීමද එහිදී සිදුවිය.



එහිදී එල්ටීටීඊ ත්‍රස්තවාදය උග්‍ර වූ සමයේ, මාතෘභූමියට සාමය උදාකරදීම වෙනුවෙන් සන්නද්ධ බුද්ධි බලකායේ වීරෝදාර රණවිරුවන් කළ නිර්භීත ක්‍රියා සහ කැපවීම් සිහිපත් කළ යුද්ධ හමුදාධිපති ඔවුන්ගේ වීර වික්‍රමයන් ඇගයීමට ද ලක් කළේය. මෙම වැඩසටහන් මාලාව සඳහා සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ඒකකයේ සභාපතිනි මනෝරි සලේ යන මහත්මීන් ද මියගිය රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන් රැසක් ද සහභාගී වූහ.

## ගජබා රෙජිමේන්තු පරිශ්‍රයට නව නිවාඩු නිකේතනයක්

22 වන ගජබා රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය උදෙසා සාලියපුර ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නවතමයෙන් ඉදිකළ *'The Twenty two Bungalow'* නිවාඩු නිකේතනය ඉකුත් ජනවාරි 22 වන දින විවෘත කෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.



මෙම දෙමහල් නිවාඩු නිකේතනය 22 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් බීඑස්කේ ජයසුන්දර ගේ අධීක්ෂණය යටතේ එම ඒකකයේ භටපිරිස්වල ඉංජිනේරු දැනුම හා ශ්‍රමදායකත්වයෙන් ඉදිකරන ලදී.

ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව 22 වන ගජබා රෙජිමේන්තුවේ අරමුදලින් ඉදිකරනු ලැබූ මෙම නව නිවාඩු නිකේතනය සියලු පහසුකම්වලින් සමන්විතය. මෙම ව්‍යාපෘතිය යුද්ධ හමුදාවේ "ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" බලගන්වමින් සුහසාධන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාවට නංවන ලදී.










# නව වසරට සුබපැතුම් රැගෙන යුද්ධ හමුදාධිපති උතුරට

කිලිනොච්චි, මුලතිව් සහ යාපනය ප්‍රදේශයන්හි සේවයේ නියුතු ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට ලබන්නා වූ නව වසර වෙනුවෙන් සුබ පැතුම් එක්කිරීම සඳහා ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් දෙසැම්බර් 29 වන දින සංචාරයක නිරත විය. එහිදී එම ප්‍රදේශවල හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් හමුවී ඔවුන් සමඟ සුහදව අදහස් හුවමාරු කරගත් හෙතෙම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, නිවාස ඉදිකිරීම්, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම්, මූල්‍ය පරිත්‍යාග, ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණ කටයුතු, ක්‍රීඩා පහසුකම් ලබාදීම සහ පොදු සේවාවන් ආදී විවිධ සමාජ සංවර්ධන කාර්යභාරයන් වෙනුවෙන් ත්‍රිවිධ හමුදාවේ කැපවීම ඇගයීමට ලක් කළේය.







තවද, වෘත්තීමය හමුදාවක් ලෙස ජාතික ආරක්‍ෂාව වෙනුවෙන් සියලු නිලයන්ගේ කැපවීම අගය කළ යුද්ධ හමුදාධිපති මත්ද්‍රව්‍ය උවදුර සහ අනෙකුත් සමාජ විරෝධී ක්‍රියාකාරකම් අප මාතෘභූමියෙන් තුරන් කිරීමට ලබාදෙන සහයෝගය වෙනුවෙන් සෑම පාර්ශ්වයකින්ම හමුදා සාමාජිකයන් වෙත ප්‍රශංසාව හිමිවන බව ද වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, ආරක්‍ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජ්එස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, උතුරු නාවික පෙදෙස භාර වැඩබලන ආඥාපති, පලාලි ගුවන් හමුදා කඳවුරේ අණදෙන නිලධාරී ඇතුළු ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද මෙම අවස්ථාවන්ට එක්වූහ.

# මව්බිමේ අභිමානය රැගෙන එතෙර මෙහෙයට

එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් යටතේ ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අන්තර්වාර බලකායට *(UNIFIL)* බැඳී ඇති 13 වන ලෙබනන් සාමසාධක මෙහෙයුම් කණ්ඩායමේ විසිර යාමේ පෙළපාලිය ඉකුත් ජනවාරි 30 වන දින ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ප්‍රධානත්වයෙන් පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථානයේදී පැවැත්විණ.







ලෙබනනයේ ස්ථාපිත ශ්‍රී ලංකාවේ බලකා ආරක්‍ෂක ඛණ්ඩය *(SLFPU)* නිලධාරීන් 10 දෙනකුගෙන් සහ සෙසු නිලයින් 115 දෙනකුගෙන් සමන්විත වූහ. ලෙබනනයේ ආරක්ෂක රාජකාරී භාර ගනිමින්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කාන්තා නිලධාරිනීන් දෙදෙනකු සහ කාන්තා සෙබළියන් හත් දෙනකු ඇතුළත් වන පළමු කණ්ඩායම මෙය වේ.

මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.



# සුහද හමුවක මතක සටහන්

ශ්‍රී ලංකාව සහ ජපානය අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආරම්භ කර වසර 70 ක් සපිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකාවේ ජපන් තානාපති හිදේකි මිසුකොෂ් මහතා (*Mr Hideaki mizukosh*) ඉකුත් ජනවාරි 26 වන දින පස්වරුවේ ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය.

යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවති මෙම සුහද හමුව අතරතුරදී, පසුගිය වසර 70 පුරාවට දෙරට අතර පවත්නා ද්විපාර්ශ්වික සහයෝගීතාව සහ අවබෝධය පිළිබඳ අදහස් හුවමාරු කරගත්හ. එසේම, කොවිඩ්-19 වෛරසය මෙරටින් තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාව දැක්වූ දායකත්වය මෙන්ම ජාතික සංවර්ධන කාර්යභාරය සහ කාබනික පොහොර නිෂ්පාදනය වැනි කටයුතු සඳහා යුද්ධ හමුදාව දක්වන අඛණ්ඩ සහයෝගය පිළිබඳව ද තානාපතිවරයා මෙහිදී සිහිපත් කළේය. ශිලන්ඊර, වෛද්‍යාධාර ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කරමින් මෙරට සැබෑ මිතුරෙකු ලෙස ජපානය සැමවිටම ලබාදෙන තාක්ෂණික සහයෝගය යුද්ධ හමුදාධිපති මෙම සුහද හමුවේදී කෘතවේදීව සිහිපත් කළේය.



ඕස්ට්‍රේලියාවේ කැන්බර් නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අභිනවයෙන් පත්වීම් ලද උපදේශක (ආරක්ෂක) ශ්‍රී ලංකා නාවික හමුදාවේ කපිතාන් (ජී) එස්.පී. කත්‍රිආරච්චි රාජකාරීන් සඳහා පිටත්ව යාමට පෙර ඉකුත් ජනවාරි 28 වන දින උදෑසන ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය.

නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තානාපති සහ නියෝජ්‍ය නිත්‍ය නියෝජිත ලෙසත් එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් එක්සත් ජාතීන්ගේ සාමසාධක නියෝජිත මණ්ඩලයේ ඉහළ පෙළේ උපදේශක කමිටුව සඳහා පත්කළ පළමු ශ්‍රී ලාංකිකයා ලෙසත් ඉතිහාසයට එක්වන සේවයේ යෙදී සිටින පළමු හමුදා නිලධාරියා වන යුද්ධ හමුදාධිපති තුමන් සිය ධූර කාලය තුළදී ඉටුකළ රාජකාරී ස්වභාවය පිළිබඳව ද මෙම සුහද හමුව අතරතුරදී විස්තර කළේය.



ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ධූරයේ රාජකාරී හොබවා නික්ම යන කර්නල් ඩේවිඩ් ඇල්ෆ්‍රඩ් අෂ්මන් (*Colonel David Alfred Ashman&* සහ එම ධූරයේ රාජකාරී භාර ගැනීමට නියමිත කර්නල් පී.ජේ. ක්ලේටන් (*Colonel PJ Clayton*) පසුගිය දෙසැම්බර් 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවූහ.

යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවති මෙම සුහද හමුවේදී නික්ම යන ආරක්ෂක උපදේශක සිය සේවා කාලය තුළ ලබාදුන් සහයෝගය වෙනුවෙන් යුද්ධ හමුදාධිපති වෙත සිය කෘතඥතාවය පුද කළේය. මෙම සුහද හමුව අවසානයේ යුද්ධ හමුදාධිපති විසින් නික්ම යන ආරක්ෂක උපදේශක වෙත විශේෂ සමරු තිළිණයක්ද ප්‍රදානය කරමින් එතුමන්ගේ අනාගත බලාපොරොත්තු වෙනුවෙන් සිය සුබ පැතුම් පිරිනැමුවේය.



# නව සංවර්ධන ව්‍යාපෘති නිරීක්ෂණයට





ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් ජනවාරි 29 වන දින උදෑසන දියතලාව ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන හා අලංකරණ ව්‍යාපෘති කිහිපයක් නිරීක්ෂණය කිරීමට එක්විය.

එහිදී 1 ගැමුණු හේවා පුහුණු පාසල් පරිශ්‍රය, දියතලාව දුම්රිය ස්ථානය අසල ඉදිකිරීමට යෝජිත නිලධාරීන්ගේ නවාතැන් සංකීර්ණය, 7 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සහ 17 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති යුද්ධ හමුදාධිපතිගේ නිරීක්ෂණයට බඳුන්විය.

මෙම අවස්ථාවට ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 7 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සහ 17 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# යුද්ධ හමුදාධිපති අවසන් ගෞරව දක්වයි





ආරක්‍ෂක සේනා මූලස්ථානය - වන්නි යටතේ ස්ථාපිත 563 වන බලසේනාවේ බලසේනාධිපති ලෙස රාජකාරි කළ බ්‍රිගේඩියර් කේපීඒ පෙරේරා ආර්එස්පී කොවිඩ්-19 වෛරසය ආසාදනය වී සුවය ලැබීමෙන් පසු ඇති වූ සංකූලතාවක් හේතුවෙන් මුල්ලේරියාව ජාතික බෝවන රෝග විද්‍යායතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී පසුගිය දෙසැම්බර් 31 වන දින හදිසියේ අභාවප්‍රාප්ත විය.



කඩවත ප්‍රදේශයේ පිහිටි එම නිලධාරීගේ නිවසට පැමිණි ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් අභාවප්‍රාප්ත ඔහුගේ දේහයට පුෂ්පෝපහාර පුදකර අවසන් ගෞරව දැක්විය. එහිදී බ්‍රිගේඩියර් පණ්ඩුක පෙරේරා ගේ භාර්යාව සහ දරුවන් සමඟ අදහස් හුවමාරු කරගත් යුද්ධ හමුදාධිපති එම නිලධාරීගේ හදිසි වියෝව පිළිබඳ බලවත් ශෝකය පළකරමින් එතුමන්ගේ පවුලේ සාමාජිකයන්ගේ අනාගත කටයුතු වෙනුවෙන් උපරිම සහයෝගය ලබාදීමටද පොරොන්දු විය.

# ඉගෙනුමට අත්වැලක්


සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ මියගිය හා සේවයේ යෙදී සිටින සාමාජික සාමාජිකාවන්ගේ දූවා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පුළුල් කිරීමේ අරමුණින් 2022 වර්ෂය සඳහා ඔවුනට පාසල් උපකරණ පිරිනැමීමේ උත්සවයක් පසුගිය ජනවාරි 20 වන දින සවස බත්තරමුල්ල සුහුරුපාය පරිශ්‍රයේදී පැවැත්විණි.

සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) රන්ජන් ළමාහේවාගේ හා එහි සේවා වනිතා සභාපතිනි උපේන්ද්‍රා ළමාහේවා මහත්මිය ගේ ආරාධනයෙන් මෙම උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය සහභාගි වූවාය. සරසවි වරම් ලැබූ දූවා දරුවන් සඳහා ලැප්ටොප් පරිගණක ප්‍රදානය කිරීම ද එහිදී සිදුකෙරිණ.

සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තු සංස්කෘතික කණ්ඩායමේ නර්තන අංග රැසකින් වර්ණවත් වූ මෙම උත්සවයට නාවික හා ගුවන් හමුදා සේවා වනිතා ඒකක සභාපතිනියන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වූහ.







# නත්තල සමරා සත්කාරයක්

යුද්ධ හමුදා සේවාවනිතා ඒකකයේ අධීක්‍ෂණය යටතේ ක්‍රියාත්මක විරු කැකුළු පෙර පාසල් ව්‍යාපෘතියට අයත් දියතලාවෙහි පිහිටි විරු කැකුළු පෙර පාසලෙහි ඉගෙනුම ලබන දරුවන්ගේ චිත්‍ර කලා හැකියාවන් ඇගයීම පිණිස වූ ප්‍රදර්ශනයක් පසුගිය දෙසැම්බර් 19 වන දින පවත්වන ලදී. මෙම ප්‍රදර්ශණය සඳහා දියතලාව ප්‍රදේශය අවට පෙර පාසල් 08 ක (අල්බද්දියා පෙර පාසල, ජනානන්ද පෙර පාසල, සමූප පෙර පාසල, තාරකා පෙර පාසල, ශ්‍රී විජය පෙර පාසල, ධම්මානන්ද පෙර පාසල, නවෝදය පෙර පාසල, ශ්‍රී සුමංගල පෙර පාසල) දූවා දරුවන්ගේ චිත්‍ර ඉදිරිපත් කරන ලදී.

ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් ද සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හා දියතලාව විරු කැකුළු පෙර පාසල භාර ජ්‍යෙෂ්ඨ සාමාජිකා සරිතා ලංකාතිලක මහත්මිය ගේ අධීක්‍ෂණයෙන් අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලද මෙම චිත්‍ර පදර්ශනයට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය සුජීවා නෙල්සන් මහත්මිය සහභාගී වූවාය.







# සන්නද්ධ බුද්ධි බලකායේ 29 වන සැමරුමට සේවා වනිතා ශාඛාවෙන් වැඩසටහනක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නද්ධ බුද්ධි බලකායේ 29 වන සංවත්සරයට සමගාමීව රණවිරු අනුස්මරණ උත්සවයක් සන්නද්ධ බුද්ධි බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානය කරන්දෙණිය හිදී පැවැත්විණ. එම වැඩසටහන අතරතුර සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සලේ මහත්මියගේ අදහසක් අනුව එම සේවා වනිතා ශාඛාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 21 වන දින පවත්වන ලදී.



එමගින් සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ ඉතිහාසය, වත්මන් කාර්යභාරය, දැනට සිදුකරගෙන යනු ලබන ව්‍යාපෘතීන් හා ක්‍රියාත්මක සුබසාධන කටයුතු පිළිබඳ වාර්තාමය වැඩසටහනක් ඉදිරිපත් කරන ලදී. එමෙන්ම විවිධ ව්‍යාපෘතීන් මගින් නිෂ්පාදනය කරනු ලැබූ විවිධ භාණ්ඩ වර්ගයන්හි ප්‍රදර්ශණයක් එහිදී ඉදිරිපත් කර තිබුණි. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.



# සුව මෙහෙයට පරිත්‍යාගයක්



ඇමෙරිකානු එක්සත් ජනපදයේ වෙසෙන සේනක සෙනෙවිරත්න මහතා ඇතුළු ශ්‍රී ලාංකිකයන් පිරිසක් විසින් මුඛ ආවරණ හා අත් ආවරණ තොගයක් යුද්ධ හමුදාධිපති වෙත පුද්ගලිකව පරිත්‍යාග කර ඇති අතර, එම භාණ්ඩ දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක අතර බෙදාදීමට නියමිතව ඇත. අදාළ ද්‍රව්‍ය නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලෙහි ප්‍රයෝජනය වෙනුවෙන් රෝහල් අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඒඑම්සී අත්තනායක යූඑස්පී වෙත යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ සුරතින් සංකේතාත්මකව පරිත්‍යාග කිරීම ඉකුත් ජනවාරි 03 වන දින යුහ රෝහල් පරිශ්‍රයේදී සිදුවූවාය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා වෛද්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් බ්‍රිගේඩියර් පීඒසී ප්‍රනාන්දු යූඑස්පී ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# නව අවුරුදු උදාව සමරා



2022 නව වසර සැමරීම නිමිත්තෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් සංවිධානය කෙරුණු උත්සවයක් හා තේ පැන් සංග්‍රහයක් ඉකුත් ජනවාරි 03 වන දින සේවා වනිතා ඒකක ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණ.

එහි සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ) ඇතුළු නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයින් මෙන්ම සිවිල් සේවක මහත්ම මහත්මීන් රැසක් සහභාගි වූහ. එහිදී සේවා වනිතා ඒකකයේ රාජකාරි නියුතු සෙසුනිලයින් සහ සිවිල් සේවක මහත්ම මහත්මීන් වෙත ත්‍යාග පිරිනැමීමද සභාපතිනියගේ සුරතින් සිදුවූවාය.

# නත්තල සමරා සත්කාරයක්





මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතන අතරමැදි නිවස්නයේ වාට්ටු අංක 05 හි නඩත්තු කටයුතු යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මඟින් සිදුකරනු ලබන අතර, එහි නේවාසික ප්‍රතිකාර ලබන රෝගීන් සහභාගි කරවා ගනිමින් සෑම වසරකම නත්තල් උත්සවයක්ද එම ඒකකය මඟින් පවත්වනු ලබයි.

ඒ අනුව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ සහ මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතන අතරමැදි නිවස්නයේ ප්‍රධාන මනෝ වෛද්‍ය විශේෂඥ වෛද්‍ය නෙත්මා පත්ම කුමාර මහත්මියගේ මගපෙන්වීම මත මෙවරද අසිරිමත් නත්තලට සමගාමීව එම කටයුතු උත්කර්ෂවත්ව සිදුකරනු ලැබීය. එහිදී ප්‍රතිකාර ලබන අයවලුන් වෙත දිවා ආහාරය සහ ත්‍යාග පාර්සල් පිරිනැමීමද සිදු කෙරිණ. එම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ) බ්‍රිගේඩියර් ඩීඑස් බාලසූරිය ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් සහභාගී වූහ.

# වෘත්තීය දැනුමට අත්වැලක්



යුද්ධ හමුදා සේවාවනිතා ඒකකයට අයත් දිවයින පුරා පිහිටි විරු කැකුළු පෙරපාසල් අටක් යටතේ රාජකාරි කරනු ලබන ගුරු වෘත්තියේ නියුතු සෙබළියන් සහ එම පෙරපාසල් භාර නිලධාරිනියන් සඳහා තෙදින පුහුණු වැඩමුළුවක් යුද හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ ඉකුත් දෙසැම්බර් 15 වන දින පනාගොඩ විරු කැකුළු පෙර පාසලේදී ආරම්භ කෙරිණ.

එහි සමාරම්භක උත්සවය සඳහා සභාපතිතුමිය නියෝජනය කරමින් යුද හමුදා සේවා වනිතා ඒකකයෙහි බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ) නිලධාරී බ්‍රිගේඩියර් ඩීඑස් බාලසූරිය සහභාගී විය. මෙම වැඩමුළුවෙහි ආරාධිත දේශකයින් ලෙස ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානයේ *(JMC)* පුහුණු උපදේශකයින් සහභාගී වූ අතර, යුද්ධ හමුදා විෂයන්ට අදාළ දේශන සහ පුහුණුවීම් ලබාදීම සඳහා විවිධ අංශ/ආයතන වෙතින් සහය ලබාගනු ලැබීය.

# සෙබළියන්ට නවාතැන් පහසුකම්



පනාගොඩ විරු කැකුළු පෙර පාසලෙහි සහ රූපලාවණ්‍යාගාරයෙහි රාජකාරියෙහි නිරත තුළවාසී සෙබළියන්ගේ නවාතැන් පහසුකම් ලබාදීම මෙතෙක් මහත් ගැටලුවක්ව පැවතිණ. එයට පිළියමක් ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් මත ගරා වැටී තිබුණු යුද්ධ හමුදාවට අයත් විවාහක නිවාසයක් අලුත්වැඩියා කර 2021 දෙසැම්බර් 13 වන දින පරිහරණය සඳහා ලබාදෙනු ලැබීය.

# සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාව

සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාව විසින් 2019 වසර අපොස (සා/පෙළ) සහ 2019 වසරේ අපොස (උසස්/පෙළ) සාර්ථකව සමත් වූ සිසුන්ගේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් ශිෂ්‍යත්ව, වෛද්‍ය උපකරණ, ටැබ් පරිගණක සහ පොත් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 04 වන දින රොක්හවුස් හි පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හර්ෂණි බෝතොට මහත්මිය, එම බලකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූහ.



# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස මිහිරි හේරත් මහත්මිය ඉකුත් දෙසැම්බර් මස 29 වන දින වැඩ භාරගන්නා ලදී. මෙම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛා ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් හා සෙසු සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ.

# සංඝා බලකා සේවා වනිතා ශාඛාව

2008 වසරේදී නොච්චිකුලම් ප්‍රදේශයේ සිදු වූ සතුරු ප්‍රහාරයකට ලක්වීමෙන් ආබාධිත තත්වයට පත් සෙ/281553 කෝප්‍රල් වීරප්‍රිය කේඑච්ඩී වෙත ශ්‍රී ලංකා සංඝා බලකායේ සේවා වනිතා ශාඛාව විසින් රෝද පුටුවක් සහ අත්වාරු යුගලයක් ඉකුත් නොවැම්බර් 29 වන දින පරිත්‍යාග කරන ලදී.



සංඝා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සජීවනි පීරිස් මහත්මිය ගේ අධීක්‍ෂණය යටතේ මෙම පරිත්‍යාග සිදුකරන ලද අතර, මෙම කටයුත්ත සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ. අදාළ පරිත්‍යාග සඳහා සුහුරු හංසන් සහ අමිල යාපා යන මහත්වරුන් විසින් මූල්‍ය අනුග්‍රහය සපයා තිබුණි.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාව



ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී ආබාධිත තත්වයට පත් ගාල්ලේ උඩුගම ප්‍රදේශයේ පදිංචි 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සෙ/314506 බලලත් නිලධාරී 1 එන්ඩීසී සම්පත් හට අභිනවයෙන් ඉදිකළ නව නිවසක් ඉකුත් දෙසැම්බර් 12 වන දින පරිත්‍යාග කෙරිණ. එම නිවස භාරදීමේ අවස්ථාවට පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මිය, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක, එහි සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# ගැමුණු හේවා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව

ගැමුණු හේවා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි ගීතා අතුකෝරල මහත්මියගේ උපදෙස් හා මඟපෙන්වීම මත එම රෙජිමේන්තුව යටතේ ඇති ඒකක තුළ සේවයේ නියුතු ආර්ථික අපහසුතා ඇති රණවිරුවන් හා සිවිල් සේවක මහතුන් 61 දෙනකුගේ පාසල් අධ්‍යාපනය හදාරන දූවා දරුවන් වෙත 2022 වර්ෂය වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීම පසුගිය දෙසැම්බර් මස 30 වන දින ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සිදුකෙරිණ.



# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව



සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව මගින් මාසිකව සංවිධානය කරනු ලබන ප්‍රජාසත්කාරක වැඩසටහන් අතර තවත් එක් වැඩසටහනක් 2021 දෙසැම්බර් 05 වන දින අම්බලන්ගොඩ වරුෂවිතාන වැඩිහිටි නිවාසයේදී පැවැත්විණ. ඒ අනුව වැඩිහිටි නිවාසයේ සියලුම නේවාසිකයන් වෙනුවෙන් දිවා ආහාරය පරිත්‍යාග කෙරිණ. මෙම අවස්ථාවට සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය මනෝරි සලේ මහත්මිය ඇතුළු සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව

ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා සභාපතිනියගේ උපදෙස් මත 9 (සේවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සංවිධානත්වයෙන් පසුගිය දිනෙක අනුරාධපුර රියන්සි අඳ ගොළු බිහිරි පාසලේ ශ්‍රමදාන කටයුත්තක් සිදුකර එහි සිටින දරුවන් වෙත දිවා ආහාරය හා ත්‍යාග පාර්සල් ලබාදීමට කටයුතු කෙරිණ.



# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව



වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ අනුග්‍රහයෙන් පසුගිය දෙසැම්බර් 23 වන දින යුද්ධ හමුදා රෝහලෙහි නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් පවත්වන ලදී. වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය නිල්මිණී ප්‍රනාන්දු මහත්මියගේ හා වෛද්‍ය බලකා බලකාධිපතිගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රයේ පැවති මෙම ප්‍රසංගය ශ්‍රවණය කිරීමට නේවාසිකව ප්‍රතිකාර ලබන සියලු අයවලුන්ට අවස්ථාව සලසා දී තිබිණ. නත්තල පිළිබිඹු වන කෙටි නාට්‍යයක් හා නර්තනයන් ද සමගින් විචිත්‍රවත්ව පැවති මෙම වැඩසටහනේදී නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන සියලුම රෝගීන් වෙනුවෙන් තිළිණ ප්‍රදානය කිරීමටද කටයුතු කෙරිණ. මෙම උත්සවය සඳහා යුද්ධ හමුදා රෝහල් අධ්‍යක්ෂ ඇතුළු වෛද්‍ය බලකා සේවා වනිතා සාමාජිකාවන්ද සහභාගී වූහ.

# ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය යටතේ රාජකාරී කරනු ලබන සියලුම සාමාජිකයින්ගේ පාසල් අධ්‍යාපනය ලබන දූවා දරුවන් හට නොමිලේ පාසල් අභ්‍යාස පොත් හා ශිෂ්‍යාධාර ලබාදීම එම බලකාය විසින් සෑම වර්ෂයකදීම සිදුකරනු ලබයි. ඒ අනුව 2021.12.12 දිනට යෙදී තිබූ එම බලකායේ 72 වන සංවත්සරයට සමගාමීව ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ මූලිකත්වයෙන් රුපියල් මිලියන 2.2 ක මුදලක් වැය දරා පාසල් අධ්‍යාපනය ලබන දූවා දරුවන් 2739 දෙනකු හට නොමිලේ පාසල් උපකරණ ලබාදීමට කටයුතු කරන ලදී. එසේම, 2022 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල වරම් හිමිකරගත් දූවා දරුවන් 05 දෙනකු වෙත ඔවුන්ගේ විශ්වවිද්‍යාල අධ්‍යාපන කටයුතු නිමකරන තෙක් ශිෂ්‍යාධාර පිරිනැමීමටද කටයුතු කෙරිණ. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මිය මේ අවස්ථාවේ ප්‍රධානත්වය දැරුවාය.

# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ සේවයේ නියුතු සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ පාසල් අධ්‍යාපනය හදාරනු ලබන දූ දරුවන් 176 ක් සඳහා අවශ්‍ය පාසල් අභ්‍යාස පොත් හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් සූගිය දෙසැම්බර් මස 27 දින පොල්හේන්ගොඩ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

එහිදී දරුදැරියන් 10 දෙනකු සඳහා පාසල් බෑග්, අභ්‍යාස පොත් සහ බුද්ධ ප්‍රතිමා ප්‍රදානය කිරීම සිදුවිය. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉනෝකා ඉලංගකෝන් මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද මෙම වැඩසටහන සඳහා එහි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්, නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහත්ම මහත්මීන් පිරිසක් සහභාගී වූහ.


# යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාව

2(සෙව) ශ්‍රීලයුපොදුසේබ ඒකකයේ අණදෙන නිලධාරිනී මේජර් දිශාන්ති මෙන්ඩිස් ගේ උපදෙස් හා මගපෙන්වීම මත රෙම ශ්‍රීලයුපොදුසේබ "ෆෝ වින්ග්ස්" රූපලාවන්‍යාගාරය අසල පිහිටි ගොඩනැගිල්ලේ (හබරකඩ) පලතුරු බීම හලක් *(Juice Bar)* ස්ථාපනය කර 2021 දෙසැම්බර් 06 වන දින යුද්ධ හමුදා පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එරංගා හේවාවසම් මහත්මියගේ සුරතින් විවෘත කරන ලදී.



# අභීත විරුවා

## පෙරියතම්පනේ සටනට පණදුන්



රුහුණුපුර මාතර දිස්ත්‍රික්කයේ ගොරකවත්ත තල්අරඹ කඹුරුගමුව ග්‍රාමයේ විසූ දොන් වික්‍රමසිංහ ප්‍රේමාවතී හා අබේසිරි මුණසිංහ යන දෙපළට දාව අබේසිරි මුදියන්සේලාගේ අනුර මෙලොව එළිය දුටුවේය. ඒ වර්ෂ 1968 ක් වූ ඔක්තෝබර් මස 30 වන දින මැදවලකඩ ග්‍රාමීය රෝහලේදීය. අලුත උපන් බිලින්දාට වැඩිමහලු සහෝදරියක වූ අතර, ඇය නමින් දිස්නා රංජනී නම් වූවාය.

සිප්සතර හැදෑරිය යුතු වයසට එළඹෙත්ම කඹුරුගමුවේ ශ්‍රී ඉන්ද්‍රසාර මහා විද්‍යාලයට ඇතුළත් කළ කුඩා අනුර වසර කිහිපයක ඇවෑමෙන් පාසලේ කැපී පෙනෙන සිසුවකු බවට පත්විය. ඒ උපතින් රැගෙන ආ ක්‍රීඩා කෞශල්‍යය නිසාවෙනි. අත්පන්දු හා ක්‍රිකට් ක්‍රීඩාව විෂයේ ඔහු පෙන්වූ දක්ෂතාව ඉතාමත් ඉහළ මට්ටමක පැවතියත් නිසි මාර්ගෝපදේශනය ලබාදී මෙම සිසුවා ඉහළ තලයකට ගෙන ඒමට පාසලේ, ගමේ හෝ කිසිවකු නොවුණි. 9 වන ශ්‍රේණියේදී පාසල හැර ගිය අනුර පසු කලෙක ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සම්බන්ධ වන තෙක් පවුලේ බරින් කොටසක් කරට ගන්නට වූයේ ගමේ සෑම පොදු කටයුත්තකටම උරදෙමින් ආදර්ශවත් නව යොවුන් තරුණයකු විලසිනි.

වර්ෂ 1996 දෙසැම්බර් 25 වන දින ආධුනික සෙබළෙකු වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්වූ අනුර සිය මූලික යුද පුහුණුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය වෙතින් හැදෑරීය. ඒ පනාගොඩ යුද්ධ හමුදා කඳවුරේ පාඨමාලා අංක 20 යටතේය.

සෙ/362939 සැරයන් අනුර එච්එම්
පීඩබ්ලිව්වී ආර්එස්පී
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව







හමුදා සේවයේ නියුතු අනුර

> "කෙසේ හෝ සතුරු යුද අගල අත්පත් කර ගැනීමේ අභිලාෂයෙන් සිටි සැරයන් අනුර සිය සහෝදර සෙබළුන්ටද මාර්ගෝපදේශකත්වය දෙමින් අභීතව යුද අගල දෙසට ඇදුණු අතර, එක්වරම සිරුර විනිවිද ගිය උණ්ඩ කිහිපයක් නිසා ඇද වැටුණේය. නමුත් විගස නැගිටගත් ඔහු සහෝදර සෙබළුන්ගේ ද චිත්ත ධෛර්යය පහතට වැටෙන්නට නොදී ප්‍රතිප්‍රහාර එල්ල කරමින් ඉදිරියට ඇදුණේ "පටන්ගත් සටන මියෙන තුරු අත් නොහරිමි" යන අදිටනින් යුතුවය."

අනතුරුව වර්ෂ 1997 ජුලි මස 06 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 08 වන බලඇණිය වෙත අනුයුක්ත වන ඔහු සිය හැකියාව, දක්ෂතාව හා තමා සතු ඉහළ සෙබළ විනය ප්‍රදර්ශනය කරමින් වර්ෂ 1998 ජුලි මස 31 වන දින ලාන්ස් කෝප්‍රල් නිලයට උසස්වීම් ලැබූ අතර සිවු වසරක ඇවෑමෙන් කෝප්‍රල් නිලයටද උසස්වීම් ලැබීය.

සියලුම නිලයන්ගේ පැසසුමට හා ආදරයට පාත්‍ර වෙමින් ඒකකයේ සියලුම ක්‍රියාන්විත රාජකාරී හා බාහිර කටයුතුවලදී කැපී පෙනෙන ලෙස කටයුතු කළ සෙබළකු වූ කෝප්‍රල් අනුර හට වර්ෂ 2003 දී එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා හයිටි රාජ්‍ය වෙත රපෝර්තු කළ බලඇණියේ සාමාජිකයකු වීමේ භාග්‍යය උදා විය.

තවද සංග්‍රාම භූමියේ ඔහු දැක්වූ රණශූරභාවය හේතු කොටගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පිරිනමනු ලබන රණශූර පදක්කම, නැගෙනහිර මානුෂීය පදක්කම, උතුරු මානුෂීය පදක්කම, පූර්ණභූමි පදකක්කම, උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම, 50 වන නිදහස් ස්වර්ණ ජයන්ති පදක්කම සහ එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් හයිටි දේශයේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් පිරිනමනු ලබන *MINUSTAH* යන පදක්කම්වලින් පිදුම් ලැබීමට සැරයන් අනුර වාසනාවන්ත විය.

සාම ගිවිසුම කඩ කරමින් ත්‍රස්තවාදීන් විසින් 2006 වර්ෂයේදී මාවිල් ආරු සොරොව්ව වසා දමමින් නැවත භීෂණය වපුරන්නට පටන්ගත් අතර, එය 4 වන ඊලාම් යුද්ධයට මඟ පෑදීය. එසේ ආරම්භ වූණු යුද්ධයට සමගාමීව නැවත ප්‍රතිෂ්ඨාපනය වූ 7 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත ඔහු එක්විය.

වර්ෂ 2007 ක් වූ නොවැම්බර් මස 57 වන සේනාංකයට අනුයුක්තව 572 වන බලසේනා මූලස්ථානයේ අණසක යටතේ ස්ථාපිතව තිබූ 7 වන බලඇණියේ ඩී කණ්ඩායමේ නිලධාරී අණදෙන විසින් පෙරියතම්පනේ ප්‍රදේශයේ බලය තහවුරු කර ගැනීමේ එක් පියවරක් වශයෙන් සිවු දෙනකුගෙන් යුත් කුඩා කණ්ඩායම් 3 ක් යොදවන ලදී. ඒ වන විට සැරයන් තනතුරට උසස්වීම් ලබාසිටි සැරයන් අනුර ද මෙම ක්‍රියාන්විතයට සම්බන්ධ වී සිටි අතර, 1:50000 මඩුපාර මීටර් ග්‍රිඩ් සිතියමේ ග්‍රිඩ් අංක 41759680 දරන ස්ථානයෙන් ඉදිරි සතුරු භූමිය නිරීක්‍ෂණය කිරීම සඳහා 2007 නොවැම්බර් මස 10 වන දින ආරක්‍ෂක වළල්ලෙන් පිටත් විය.

ඉංජිනේරු සෙබළුන්ගේ සහයෝගයද නොමැතිව පාබල සොල්දාදුවන් වශයෙන් ත්‍රස්තවාදීන් විසින් අටවන ලද මර උගුල්, බිම්බෝම්බ නිෂ්ක්‍රිය කරමින් වෙඩි වරුසා මධ්‍යයේ සතුරු භූමිය හා ඒ අවට භූමිය මැනවින් නිරීක්‍ෂණය කළ ඔවුන් අදාඅගල් වලට දැවැන්ත ප්‍රහාර එල්ල කිරීමට අවැසි සියලු තොරතුරු ඒකරාශී කරගෙන නැවත ආරක්‍ෂක වළල්ල තුළට පැමිණි අතර, එසේ රැස්කරගත් බුද්ධි තොරතුරු වලට අනුව සැරයන් අනුර විසින් ප්‍රහාරය දියත් කිරීමට අවශ්‍ය සියලු සැලසුම් සකස් කර තමා සමඟ නිරීක්‍ෂණ කටයුතු සඳහා සහභාගි වූ සෙබළුන්ද සමඟ පසුදින අලුයම 0500 පැයට නැවත පිටත් විය.

ත්‍රස්තවාදී බිම්බෝම්බ හා මර උගුල් ඉවත්කර ප්‍රහාරය සඳහා උපක්‍රමශීලීව එම ස්ථානය වෙත ළඟාවූ අතර, ඔවුන් හා මුර රාජකාරියේ යෙදී සිටි කොටි ත්‍රස්තවාදීන් හා ක්‍ෂණික ගැටුමක් ඇතිවූයේ අනපේක්‍ෂිත ලෙසිනි.

කෙසේ හෝ සතුරු යුද අගල අත්පත් කර ගැනීමේ අභිලාෂයෙන් සිටි සැරයන් අනුර සිය සහෝදර සෙබළුන්වද මාර්ගෝපදේශකත්වය දෙමින් අභීතව යුද අගල දෙසට ඇදුණු අතර, එක්වරම සිරුර විනිවිද ගිය උණ්ඩ කිහිපයක් නිසා ඇද වැටුණේය. නමුත් විගස නැගිටගත් ඔහු සහෝදර සෙබළුන්ගේ ද චිත්ත ධෛර්යය පහතට වැටෙන්නට නොදී ප්‍රතිප්‍රහාර එල්ල කරමින් ඉදිරියට ඇදුණේ "පටන්ගත් සටන මියෙන තුරු අත් නොහරිමි" යන අදිටනින් යුතුවය.

■ යුද්ධ හමුදා මූලස්ථානය විසින් ප්‍රකාශිත "උත්තමාචාරය" ග්‍රන්ථයෙන් උපුටා ගැනිමකි.

# ගැබිනි මවුවරුන්ට දිරියක්





7 වන ගජබා රෙජිමේන්තුවේ 31 වන සංවත්සරයට සමගාමීව අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව්එස්අයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ගේ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ කොඩිකාමම් ප්‍රදේශයේ ගැබිනි මවුවරුන් 31 දෙනකු සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් පාර්සල් පරිත්‍යාග කිරීමේ උත්සවයක් ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 22 වන දින පවත්වන ලදී. රුපියල් 3000.00 ක් පමණ වටිනාකමකින් යුත් මෙම අත්‍යාවශ්‍ය පාර්සල් සඳහා අනුග්‍රාහකත්වය ඒකකයේ රාජකාරී නියුතු නිලධාරී සහ සෙසුනිලයින් විසින් ලබාදී ඇත. මෙම උත්සව අවස්ථාව සඳහා 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 522 වන බලසේනාධිපති ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# අණදෙන නිලධාරීන් සඳහා දෙදින වැඩමුළුවක්



ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත යාපනය අර්ධද්වීපයේ ස්ථාපිත ඒකකයන්හි අණදෙන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් දෙදින වැඩමුළුවක් ඉකුත් දෙසැම්බර් 30 සහ 31 යන දිනයන්හිදී යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේදී පවත්වන ලදී.

ආරාධිත දේශකයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ මෙම වැඩමුළුවට යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයක් වූ *(Army Way Foward Strategy 2020 - 2025)* සඳහා බලඇණිවල ක්‍රියාකාරීත්වය, ඒ සඳහා ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරීම, ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම, අණදෙන නිලධාරියකු සතු වගකීම් සහ සමාජ මාධ්‍ය කෙරෙහි යුද්ධ හමුදාවේ බලපෑම, සිවිල් ජනතාව සමඟ වැඩ කිරීම, නිලධාරීන්ගේ වෘත්තීය ප්‍රගතිය, තම හටපිරිස් මෙහෙයවීම ආදී කරුණු පිළිබඳ විද්වත් දේශන සහ සාකච්ඡා මාලාවක් ඇතුළත් විය.

# වන්නි ආඥාපති සේනාංක සංචාරයක



ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් දෙසැම්බර් 28, 29 30 සහ 31 යන දිනයන්හිදී එම බල ප්‍රදේශයට අයත් 21, 54, 56 සහ 65 වන පාබල සේනාංකයන්හි සංචාරයක නිරත විය. එහිදී, ආඥාපති විසින් එම සේනාංකවල රාජකාරී ස්වභාවය හා සෙබළ සුබසාධනය පිළිබඳ කටයුතු සොයා බැලූ අතර, එහි රාජකාරී කරනු ලබන සියලු නිලයන් ඇමතීමට ද එහිදී ඔහු අමතක නොකළේය.



# අඩු ආදායම්ලාභී පවුලක් වෙත නව නිවසක්

වැලිකන්ද, කන්දකාඩු ප්‍රදේශයේ වෙසෙන අඩු ආදායම්ලාභී පවුලක් වෙනුවෙන් නව නිවසක් ඉදිකරදීම සඳහා පසුගිය ජනවාරි 11 දින මුල්ගල තැබිණ. නැගෙනහිර පළාතේ වෙසෙන අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ඕස්ට්‍රේලියාවේ වෙසෙන නිහාල් උඩුගම සූරියගේ මහතා ඊට මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.

23 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඑන්එන් කොස්වත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ 233 වන බලසේනාවේ බලසේනාධිපති කර්නල් ආර්ඩබ්ලිව්කේ හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් මත ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ ස්ථාපිත 9 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භටපිරිස් හි තාක්ෂණික දැනුම සහ ශ්‍රම දායකත්වය යොදාගනිමින් මෙම නව නිවස ඉදිකෙරේ. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරී කර්නල් එන්යූජේඑස් ගුණවර්ධන, 9 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව්එම්ටීඩී වනිගසේකර යූඑස්පී පීඑස්සී අයිජී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයින් මෙන්ම නිවාසලාභී පවුලේ සාමාජිකයින් සහභාගී වූහ.





# හරිත රැකුමට මුල්වෙමින්



ඉරණමඩු ජලාශයට මායිම්ව 1 වන බලකා කඳවුරු භූමියේ මී පැළ 300 ක් රෝපණය කිරීම ඉකුත් දෙසැම්බර් 15 වන දින බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. 1 වන බලකාය වෙතින් පවත්වාගෙන යනු බලන හරිතාගාරය නිරීක්ෂණය කිරීමටද එහිදී බලකාධිපති එක්විය. මෙම අවස්ථාවට බ්‍රිගේඩියර් (පාලන/හකාස) ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.



# නව පරිගණක විද්‍යාගාරයක් සිසු අයිතියට





කිලිනොච්චිය වලෛයිපාඩු රෝමානු කතෝලික දමිළ මිශ්‍ර පාසලේ රුපියල් ලක්ෂ 10 ක් පමණ වැයකර ඉදිකරනු ලැබූ පරිගණක විද්‍යාගාරයක් ඉකුත් දෙසැම්බර් 20 වන දින 1 වන බලකායේ බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් විවෘත කර සිසු අයිතියට පවරා දෙන ලදී. කොමර්ෂල් බැංකුවේ සමාජ සත්කාරක භාරයේ මූල්‍ය දායකත්වයෙන් ඉදිකළ මෙම පරිගණක විද්‍යාගාරය විවෘත කිරීමේ අවස්ථාවට 663 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑච්එන්පී හැන්නැදිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, එම විදුහලේ ආචාර්ය මණ්ඩලය ඇතුළු සිසු සිසුවියන් රැසක් සහභාගී වූහ. 1 වන බලකායේ මනෝවිද්‍යා හා තොරතුරු සංග්‍රාමික අංශය විසින් මෙම වැඩසටහන සම්බන්ධීකරණය කළ අතර, 2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් එහි ඉදිකිරීම් කටයුතු සිදු කළහ.

# හරිත කෘෂිකර්ම සංකල්පයට දායක වෙමින්




රජය විසින් ක්‍රියාත්මක කරන ලද හරිත කෘෂිකර්ම සංකල්පයට අනුව යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් හා මඟපෙන්වීම මත කඳවුරු තුළ ද වගා සංග්‍රාමයක් ඇරඹුණු අතර ඒ අනුව 66 වන පාබල සේනාංක මූලස්ථාන පරිශ්‍රයේ ද හරිතාගාර තුළ වගාකිරීම ආරම්භ කරන ලදී. 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයෙන් ඉකුත් ජනවාරි 03 වන දින ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ විසින් එම හරිතාගාරයේ සිටවන ලද මාලු මිරිස් අස්වනු නෙළීම සංකේතාත්මකව සිදුකරන ලදී. එහිදී ආඥාපති විසින් එම සේනාංකයේ රෝපණය කිරීම සඳහා පැළ බෙදාදීමක් ද සිදු කරන ලදී.

තවද මෙම බල ප්‍රදේශයේ ප්‍රථම වරට කාබනික පොහොර යොදා වගා කරන එළවලු සඳහා කාබනික දියර පොහොර හා කාබනික කෘමි විකර්ෂක හඳුන්වාදීම ද සිදුකරන ලදී. මෙම වැඩසටහන සඳහා ආසේමු (මුල), 66 වන පාබල සේනාංකයේ නිලධාරීන් හා සෙසු නිලයින් රැසක් සහභාගී වූහ.

# දැනුම දිනන්නට දිරියක්


66 වන පාබල සේනාංක මූලස්ථාන බලප්‍රදේශයට අයත් 661 වන පාබල බලසේනා මූලස්ථානය යටතේ ඇති පරමන්කිරායි රජයේ දමිළ මිශ්‍ර විද්‍යාලයේදී පාසල් ළමුන් 100 දෙනකු සඳහා පාසල් බෑග් හා පොත්පත් ඇතුළු උපාංග ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගිය ජනවාරි 04 වන දින පැවැත්විණ. මෙම උත්සවය සඳහා 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයෙන් ආරක්ෂක සේනා (මුලතිවු) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සහභාගී විය.




මෙම මාහැඟි සත්කාරය සඳහා අනුග්‍රහය හැටන් නැෂනල් බැංකුව විසින් ලබාදුන් අතර පුනරින් ප්‍රදේශයේ ඇති පාසල් 10 ක දිළිඳු පවුල්වල සිසුන් 100 දෙනකුට එහිදී පරිත්‍යාග ලබාදෙන ලදී. මෙම වැඩසටහන සඳහා ආසේමු (මුල) කර්නල් ප්‍රමානි හා 66 වන පාබල සේනාංක මූලස්ථානයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී, 5 (සෙව) යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සහ 22 විජයබාහු පාබල රෙජිමේන්තු අණදෙන නිලධාරීවරු ද සහභාගී වූහ.

# බලසේනා සංචාරයක්





ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් ජනවාරි 04 වන දින 142 වන පාබල බලසේනාවෙහි කඳවුරු සංචාරයක නිරත විය. 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී හා 142 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එච්වීඑ් සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් එහිදී ආඥාපති සාදරයෙන් පිළිගනු ලැබූහ. මෙම සංචාරයේදී එම බලසේනාවේ සහ ඒ යටතේ ස්ථාපිත ඒකකවලට අයත් නිලධාරීන් සහ සෙබුනිලයන්ගේ පාලන අවශ්‍යතා පිළිබඳ සොයා බැලූ ආඥාපති එම භටපිරිස් ඇමතීමටද අමතක නොකළේය.

# අඩු ආදායම්ලාභී තවත් පවුලක් සඳහා නිවසක්



61 වන පාබල සේනාංකයේ මඟපෙන්වීම යටතේ 14 වන ගැමුණු හේවා බළඇණියේ භට පිරිස් විසින් සිරස මාධ්‍ය ජාලයේ මූල්‍යමය සහයෝගීතාව ඇතිව බමදූව, වටවන ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුලක් වන එස්පී ජාලිය නිශ්ශංක මහතා වෙනුවෙන් පසුගියදා නව නිවසක් ඉදිකර දෙන ලදී.

61 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ සිරස විද්‍යුත් මාධ්‍ය සමූහ අධ්‍යක්‍ෂිකා නීදා වීරසිංහ මහත්මිය මෙම නිවස ප්‍රදානය කිරීම සඳහා සහභාගී වූහ.

මෙම අවස්ථාවට වනාපෘති භාර නිලධාරී ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) බ්‍රිගේඩියර් ටීසීඑල් ගනේපොල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, 613 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේජීයූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී අයිජී පීඑස්සී, 14(සේව) ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරී මෙන්ම සිරස විද්‍යුත් මාධ්‍ය ජාලයට සම්බන්ධ නිලධාරීහු පිරිසක් ද එක්වූහ.



# ගර්භිණී මව්වරුන් වෙත පරිත්‍යාගයක්





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බල ප්‍රදේශය තුළ ජීවත්වන අඩු ආදායම්ලාභී ගර්භිණී මව්වරුන් 25 දෙනකු සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මූලිකත්වයෙන් ඇන්කර් ෆොන්ටේරා සමාගමේ අනුග්‍රහයෙන් පෝෂ්‍යදායි නිෂ්පාදන අඩංගු පෝෂණ මල්ලක් සහ දරු ප්‍රසූතියේදී අත්‍යාවශ්‍ය භාණ්ඩ කට්ටලය බැගින් පරිත්‍යාග කෙරිණ. මාතර කෝට්ටේගොඩ බෙලිඅත්ත ශ්‍රී සුදර්මාශ්‍රම විහාරාධිපති රාජකීය පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී බුද්ධියාම ධම්මසේන හිමිපාණන් වහන්සේගේ අනුග්‍රාහකත්වය ඇතිව එම මවුවරුන් වෙත අදාළ ද්‍රව්‍ය ලබාදීම පසුගියදා දියතලාව විරු කැකුළු පෙර පාසලේදී සිදුකරන ලදී.

---

# සුහදත්වය වර්ධනයට ක්‍රිකට් තරඟාවලියක්





ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අදහසකට අනුව ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ පාලනය වන ඒකකයන් නියෝජනය කරමින් සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් ඉකුත් දෙසැම්බර් 11 සහ 12 යන දෙදින තුළ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) මුතුකුමරු ක්‍රීඩාංගණයේදී පැවැත්විණ.

මෙම ක්‍රිකට් තරඟාවලිය නියෝජනය කරමින් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම), 7 වන ශ්‍රී ලංකා සංඥා බලකාය, 8 වන සන්නද්ධ බුද්ධි බලකාය, 7 වන පොලිස් සේවා බලකාය, 17 වන ඉංජිනේරු සේවා බලකාය, 8 වන යුද්ධ හමුදා සේවා බලකාය සහ 2(සෙව්) විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය යන ඒකක කණ්ඩායම් තරඟ කළහ. එහිදී අවසන් මහා තරඟය සඳහා 7 වන ශ්‍රී ලංකා සංඥා බලකාය සහ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) කණ්ඩායම සුදුසුකම් ලැබූ අතර, ඉන් 7 වන ශ්‍රී ලංකා සංඥා බලකාය ජයග්‍රහණය කරන ලදී. තරඟයේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) සෙ/703771 කෝප්‍රල් රාජපක්ෂ ආර්සී අභිසෙස් ලැබීය.

ජයග්‍රාහී කණ්ඩායම් සහ අනෙකුත් කණ්ඩායම් සඳහා සහතික පත්‍ර සහ කුසලාන ආඥාපති සුරතින් ලබාදුන් අතර, මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ රාජකාරි නියුතු නිලධාරීන් සහ සෙබළුන් රැසක් සහභාගි වූහ.

# දෙස නඟන විරුවන්ගේ පළමු සැමරුම

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය

"ජාතික අවශ්‍යතාව මැනවින් හඳුනා ගනිමින් පිහිට වූ කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය ස්වයංපෝෂිත දේශයක් ගොඩනැඟීමේ දැවැන්ත යුග මෙහෙවරට සාජුව දායක වී සිටිනුයේ එම ක්ෂේත්‍රයේ නියැළි සැමට ආදර්ශයක් ද ලැබ දෙමිනි. දෙස සුරැකි විරුවන්ගේ දෑත්වලින් දෙස ගොඩනැඟෙන අපූරුව කියාපානුයේ අනාගත ශ්‍රී ලංකාවේ ස්වර්ණමය යුගයක පෙරනිමිතිය."







ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය ජාතියට ඉමහත් අභිමානයක් එක් කරමින් වසරක් පුරාවට විශිෂ්ට හා කීර්තිමත් සේවයක් රට දැය වෙනුවෙන් ඉටු කරමින් ඉකුත් ජනවාරි මස 04 වන දින සිය 1 වන සංවත්සරය සමරනු ලැබීය. එම අභිමානවත් සැමරුම් අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ සහ කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී සහභාගී විය.

සංවත්සරයට සමගාමීව ඉකුත් නොවැම්බර් මස 03 වන දිනෙන් ඇරඹී වැඩසටහන් රාශියක් පැවති අතර, එහිදී ආගමික වතාවත්වලට මුල්තැනක් හිමිවිය. එසේම සංවත්සර දින බලකාධිපති වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය ද පිරිනැමුණු අතර, රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය වෙත නව කරපටි ලාංඡන පැළඳවීම ද බලකාධිපති අතින් සිදුවීම මෙවර සංවත්සර දින සිදුවූ විශේෂ කටයුත්තකි. අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව අලුතින් ස්ථාපනය කරන ලද කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ අභිමානය නංවාලීම සඳහා එහි සාමාජිකයන් විසින් කරන ලද ධෛර්ය සම්පන්න සහ උද්යෝගීමත් කැපවීම සංවත්සර දිනයේ බලකාධිපතිගේ නොමඳ පැසසුමට බඳුන් විය.



## කාබනික පොහොර නිපදවීම පිළිබඳ වැඩමුළුවක්





682 වන පාබල බලසේනා මූලස්ථාන බලප්‍රදේශයේ පදිංචිව සිටින සිවිල් ජනතාව අතරින් කාබනික සණ හා දියර පොහොර නිපදවීමට උනන්දුවක් දක්වන පුද්ගලයින් සඳහා ඒවා නිපදවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඉකුත් ජනවාරි 06 වන දින කෙවේලි සෙල්ව පාක්කාම් ගොවිපලේ දී පවත්වන ලදී. මේ සඳහා ගොවි මහතුන් 36 දෙනකු සහභාගී වූහ. ආරක්ෂක සේනා (මුලතිවු) ආඥාපති ගේ උපදෙස් මත 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මගපෙන්වීමෙන් මෙම කටයුත්ත සිදුකෙරිණි.

## යුද්ධ හමුදා දිවියට වෘත්තීය නිපුණත්වය ලබාදෙමින්



යුද්ධ හමුදාවෙහි කනිෂ්ඨ නිලයන්ගේ අනාගත අභිවෘද්ධිය සලස්වමින් ඔවුන්ගේ වෘත්තීය නිපුණත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම පිණිස වූ කනිෂ්ඨ නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව - අංක 42 ඉකුත් ජනවාරි 18 වන දින අම්පාර සටන් පුහුණු පාසලේදී ඇරඹිණ. යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් සාමාජික සාමාජිකාවන් 121 දෙනකුගේ සහභාගීත්වයෙන් ඇරඹි මෙම පාඨමාලාවේ ආරම්භක දේශනය එම පුහුණු පාසලෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී විසින් සිදුකරන ලදී.



## ලේ දන්දීමේ වැඩසටහනක්

රාජ්‍ය ලේ බැංකුවල ඇති රුධිර සංචිත පවත්වාගෙන යාමේ අවශ්‍යතාව මත 15 (සේවා) බලඇණිය ගජබා රෙජිමේන්තුවේ සංවත්සර දිනයට සමගාමීව ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 06 වන දින පැවැත්විණ. යාපනය ශික්ෂණ රෝහලෙහි වෛද්‍යවරුන්ගේ හා හෙද කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් යුතුව පැවති මෙම අවස්ථාවට එම ඒකක අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව්ආර් ප්‍රසන්න, 52 වන පාබල සේනාංකයෙහි හා ඒ යටතේ ස්ථාපිත පාබල බලසේනා මූලස්ථානයන් මෙන්ම ඒකකයන්හි රාජකාරී කරනු ලබන නිලධාරීන්, සෙසුනිලයන් හා සිවිල් සේවක මහතුන් ඇතුළුව 84 දෙනකු සහභාගී වූහ.



# ඉන්දීය විරුවන් සැමරේ

එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් සමඟ පැවැති සටනේදී ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව සමඟ එක්ව, ශ්‍රී ලංකාවේදී දිවිපිදූ ඉන්දීය සාම සාධක හමුදාවේ *(IPKF)* වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කිරීමේ උත්සවයක් 73 වන ඉන්දීය ජනරජ දිනයට සමගාමීව ඉකුත් ජනවාරි 26 වන දින යාපනය, පලාලි හි පිහිටි ඉන්දියානු සාමසාධක හමුදා ස්මාරකය අභියසදී පැවැත්විණි.



වර්ෂ 1991 ට පෙරාතුව, ශ්‍රී ලංකාවේ ආරක්ෂාව උදෙසා යොදවා සිටි ඉන්දීය සාමසාධක හමුදාවේ දිවිපිදූ එම වීරෝදාර රණවිරුවන් සිහිපත් කරමින් ඔවුනට පුෂ්පෝපහාර පුදකිරීමේ අවස්ථාවට යාපනයේ වැඩබලන ඉන්දීය කොන්සල් ජෙනරාල් කාර්යාලයේ කොන්සල් ජෙනරාල් රාම් මහේෂ් මහතා සහ ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගි වූහ. විශේෂයෙන්ම වර්ෂ 1987 සිට 1989 දක්වා කාලය තුළ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට එරෙහිව යාපනයේ පැවති "පවන් මෙහෙයුම" අතරතුරදී සිය ජීවිත පූජා කළ විරුවන් එහිදී අනුස්මරණය කෙරුණු අතර, එම අවස්ථාවට යාපනයේ පිහිටි ඉන්දීය කොන්සල් ජෙනරාල් කාර්යාලයේ නිලධාරීන් සහ යුද්ධ හමුදා නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.

# දැනුවත් කිරීමේ දේශන මාලාවක්

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යුද්ධ හමුදාවේ රියදුරු වෘත්තිකයන්, අරක්කැමියන්, භෝජනාගාර සේවක සේවිකාවන්, III කම්කරුවන් හා සනීපාරක්ෂක කම්කරුවන් සඳහා ආරක්ෂක සේනා මූලස්ථාන මට්ටමින් "ගෞරවනීය මාර්ගය" යන තේමාව යටතේ දේශන මාලාවක් සංවිධානය කරනු ලබයි. එහි එක් පියවරක් ලෙස 2022 ජනවාරි මුල් සතිය තුළ 1 වන බලකාය, 64 වන පාබල සේනාංකය හා 14 වන පාබල සේනාංකය ආවරණය වන පරිදි දේශන පැවැත්විණ. මෙම දේශන ලුතිනන් කර්නල් ටීආර් ජුමාර් හා මේජර් එච්කේඑස්එස් දිලන්ත පීඑස්සී ඒටීම් යන නිලධාරීන් විසින් මෙහෙයවනු ලැබූහ.







# ලෙව්කේ දිසාව සහ ලෙව්කේ කාලතුවක්කුව



ලෙව්කේ කාලතුවක්කුව

1803 දී කන්ද උඩරට රාජධානිය අල්ලා ගැනීමට පැමිණි ඉංග්‍රීසි හමුදාවට වාගොල්ලේ දී මාරාන්තික ප්‍රහාරයකට මුහුණ දීමට සිදු වූයේ, එවක රජුට අති දක්ෂ යුද සෙන්පතියන් සිටියා සේම යුද්ධයක් ජය ගැනීමට තරම් දියුණු තාක්‍ෂණික ක්‍රම උපයෝගී කරගෙන අපගේ හෙළයන්ගේම දෑතින් නිපද වූ අවි ආයුධ භාවිතයේ වූ නිපුණත්වය ඉතා උසස් මට්ටමක තිබූ හෙයිනි. ඒ අතර, අත් තුවක්කු, ගිනි තුවක්කු සහ කාලතුවක්කු වැනි අවි ආයුධ යොදාගෙන සිදුකරන ලද සටන් ජයග්‍රණයෙන්ම අවසන් කිරීමට යෝධ ශක්තියක් වී තිබුණේ සිංහල රජුට පක්ෂපාතී හා අති දක්ෂ යුද ශිල්පයෙහි පරිණත වූ යුද සෙන්පතියන් අතර ලෙව්කේ දිසාව වැනි ශ්‍රේෂ්ඨ නායකයන් විශාල ප්‍රමාණයක් රජු වටා පෙළ ගැසී සිටි හෙයිනි.


සිංහලයන්ගේ පුරාණ අවි ආයුධ හා ඒවා භාවිතය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු රාශියක් තවමත් ඉතිරිව ඇති අතර, ඒ තුළින් පැහැදිලි වන කරුණක් වන්නේ අපේ හෙළයන්ගේ තුවක්කු නිපදවීමේ තාක්ෂණික දැනුම ඉතාම ඉහළ අගයක පැවති බවයි. එමෙන්ම "ඩී කූටෝ" නමැති ලේඛකයා සඳහන් කරන ආකාරයට සීතාවක රාජසිංහ රජතුමා සමග (ක්‍රි:ව 1554-1593) කොළඹ පරංගි කොටුවට පහර දීමට එක් වූ සිංහල හමුදාව සතු වූ කාලතුවක්කු 150 ක් පමණ භාවිත කර ඇති බවයි.

සතර කෝරළයේ "ගල් අතර" නම් වූ සුන්දර ගම්මානයේ රදළ පවුලකින් පැවත ආ ලෙව්කේ විජයසුන්දර රාජකරුණා හේරත් මුදියන්සේ (ලෙව්කේ ජේෂ්ඨ) දිසාවගේ පුත්‍රරුවන වූ ලෙව්කේ විජයසුන්දර රාජකරුණා සෙනෙවිරත්න හේරත් මුදියන්සේ (ලෙව්කේ රාළ) අවසන් සිංහල රාජධානියේ ඉහළින්ම කැපී පෙනුණ චරිතයකි. ඉතාමත් කඩවසම්, ගාම්භීර දේහධාරියකු වූ ලෙව්කේ දිසාව අති දක්ෂ මල්ලව පොර ශූරයකු වී ඇත්තේ කපිතාන් අසාන් මුහන්දිරම් නමැති මැලේ ජාතිකයකුගෙන් මල්ලව පොර ඉගෙන ගැනීමෙනි. අවිවාහකයකු වූ ලෙව්කේ දිසාවගේ ආගමානුකූල දිවි පැවැත්ම මෙන්ම විනෝදකාමී ප්‍රතාපවත් වූ ප්‍රතිරූපය පහත කවියෙන් මොනවාට වැටහෙම් ද?

| | |
|---|---|
| **ඉඳගත්තම පිළිමය තිබ්බා** | **වාගෙයි** |
| **නැගිටපුවම වේපත බැන්දා** | **වාගෙයි** |
| **යන එන ගමන් විදුලිය කෙටුවා** | **වාගෙයි** |
| **ලෙව්කේ මැතිඳු ගල් අතරට කොත** | **වාගෙයි** |

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු, වාගොල්ලේ සටන ජය ලැබීමෙන් පසු උද්දාමයට පත් වී ඉන් අනතුරුව හංවැල්ල ප්‍රදේශයේ ඉදිකර තිබූ ඉංග්‍රීසි බලකොටුවට පහර දීමට තීරණය කරනු ලැබුවා. එම සටනේ සටන් සගයා මෙන්ම සටන ජයග්‍රහණය කරා රැගෙන යන යෝධ ශක්තියක් බඳු සටනේ නියමුවා වූ ලෙව්කේ දිසාවගේ අව්‍යාජ දක්‍ෂතාවට ඊර්ෂ්‍යා කරන ලද, සෙස්සන් රජුට ගතු කියා රජු සමඟ බේද බින්න කරවිය. රජුගේ වැරදි වැටහීමෙන් ලෙව්කේ දිසාව හිස ගසා මරා දැමීමට නියෝග කිරීම රජුගේ අවසන් තීරණය විය.

මෙම වකවානුව මෙරටදී අධිරාජ්‍යවාදීන්ට එරෙහිව මෙහෙයවන ලද සටන් විශාල ප්‍රමාණයක් අවසානයේ ජයපැන් භුක්ති විඳි යුගයකි. එම සියලු ජයග්‍රහණ පිටුපස වූ ශක්තිය වූයේ සිංහල සටන් සගයන්ගේ සටනේ අති දක්ෂ බව, යුද උපාය පිළිබඳ වූ තාක්ෂණික දැනුම හා කිසිදා සතුරාට යටත් නොවන අභීත නායකත්වය යන ගුණාංග වේ. එලෙසට ඔවුන් මෙරටදීම නිපදවන ලද අත් තුවක්කු, කාලතුවක්කු, බොන්ඩික්කුලම වැනි ගිනි අවි පිළිබඳ තැබූ විශ්වාසය ඉතා වැදගත් විය.



ලෙව්කේ දිසාව



කොළඹ අවිස්සාවේල්ල අළුත් පාර හා පරණ පාර වෙන්වන ස්ථානයේ කළුඅග්ගල මංසන්ධියේ පිහිටා ඇති ලෙව්කේ දිසාවගේ ස්මාරකය

මෙරටදීම ගිනි අවි නිපද වූ අපගේ හෙළයන්, තුවක්කු නිපදවීමේ තාක්ෂණික දැනුමෙන්ද පරිණතව සිටි එම යුගයේ දී එලෙස නිපදවන ලද තුවක්කු රජු වෙත ප්‍රදානය කිරීමද කැපී පෙනෙන ලක්ෂණයක් විය. ලෙව්කේ දිසාවගේ රාජ්‍ය පක්‍ෂපාතීභාවය ගැන පැහැදුණු රජු විසින් ඔහුට ගම්බිම් ප්‍රදානය කිරීම හේතුකොටගෙන එයින් සතුටට පත් ලෙව්කේ දිසාව රජුට කෘතගුණ සැලකීමක් වශයෙන් අලංකාර කැටයමින් නිර්මිත රෝද යුගලක් මත නංවන ලද අති විශිෂ්ට කාලතුවක්කුවක අනුරුවක් තනා එම සුවිශේෂී දිනයද ඒ මත කොටා විජය රාජසිංහ රජු හට පරිත්‍යාග කරන ලදී. එම සිදුවීම චිරාගත සම්ප්‍රදායන් එදා සිටම පැවත ආ බවට තිබෙන ඉතිහාසගත වටිනා සාක්‍ෂියකි. පසුව 1765 දී ලන්දේසීන් විසින් මහනුවර ආක්‍රමණය කළ විට මෙම අගනා කාලතුවක්කු සිහිවටනයේ වූ පෙනුම හා අලංකාර බව නිසා ඕලන්ද රජු පස්වන විලියම් කුමාරයා හට ප්‍රදානය කරන ලදී. එම සිදුවීමත් සමඟ එලෙස පිරිනැමූ කාලතුවක්කුව ලෙව්කේ කාලතුවක්කුව

ලෙස ව්‍යවහාර වූ අතර, දැනට එය නෙදර්ලන්තයේ, " ඇම්ස්ටර්ඩෑම්" කෞතුකාගාරයේ තැන්පත්කර තිබේ. එහි තවත් ආකෘතියක් කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

යුක්තියත් කීර්තියත් ඉතිරිකර දුන් සෙන්පතියන් රැකගැනීමට එදා සිටි තෘෂ්ණාධික, තොහික්මුණු නපුරු රජවරුන් හට නොහැකි වීම කණගාටුවට කරුණකි. එය හොඳින්ම පසක් වන්නේ සතර කෝරළය භාර ලෙව්කේ දිසාව රාජ නියමයෙන් හංවැල්ලේ වක්ඔය අසල කළුඅග්ගල වෙල්යාය මැද දී හිස ගසා මරණයට පත් කිරීමයි. රජුගේ අදූරදර්ශී එම තීරණයෙන් මරණ මංචකයෙහි සිටි ලෙව්කේ දිසාවගේ ගාම්භීර, එඩිතර ප්‍රතාපවත් ප්‍රතිරූපය පහත ජන කවියෙන්ම පැහැදිලි වේ.

ඉහත සිදුවීමට සම්බන්ධ ලෙව්කේ දිසාවගේ ස්මාරකය කළුඅග්ගල මංසන්ධියේ (කොළඹ අවිස්සාවේල්ල අලුත් පාර හා පරණ පාර වෙන්වන ස්ථානයයි) අදට

**පුන්සඳ සේම පායාලා රට මැද්දේ**
**රන්කෙඳි සේම පීරාලා පිට මැද්දේ**
**මාර සෙනග වටකරගෙන යම යුද්දේ**
**ලෙව්කේ මැතිඳු අද තනියම වෙල මැද්දේ**

ද ජීවමානව වැජඹුණද එය පසුකර දිනකට යන ලක්ෂ සංඛ්‍යාත ජනයාගෙන් එම ස්ථානයේ තිබෙන්නේ උදාර මෙහෙයක් රට ජාතිය වෙනුවෙන් ඉටුකර නිභඩ වීරයෙකුගේ තවත් තික්ම යාමක් වෙනුවෙන් ඉදි වූ ස්මාරකයක් බව දන්නේ කීයෙන් කී දෙනාද?

වේදනාබරිත වූ මෙවන් අමිහිරි අතීතයක් පසුකොට පැමිණි ගමන්මගේ එක්තරා සුවිශේෂී සන්ධිස්ථානයකදී, එනම් 1888 අප්‍රේල් මස 12 වන දින මෙරට කාලතුවක්කු හමුදාවකට මුල පිරීම සඳහා වූ මුල්ම අඩිතාලම දැමීම බ්‍රිතාන්‍ය රාජකීය කාලතුවක්කු හමුදාව යටතේ සිදු විය. එදා අපගේ හෙළයන්ගේ දෑතින්ම නිපද වූ කාලතුවක්කු යොදාගෙන අධිරාජ්‍යවාදීන්ට එරෙහිව සටන් වැදුණ ද, ඊට වසර කීපයකට පසු අධිරාජ්‍යවාදී ජාතියක් වූ බ්‍රිතාන්‍ය ජාතිකයින්ම මුල් වී මෙරට කාලතුවක්කු හමුදාව ඇතුළු සෙසු හමුදා ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කිරීමද දෛවෝපගත සිදුවීමකි.

මේජර් එම්ජී සාලින්ද පීඑස්සී - ශ්‍රීලකාහ
මාහි 2 (මූල්‍ය කළමනාකරණ හා ප්‍රසම්පාදන)
පර්යේෂක

# ලෙව්කේ කාලතුවක්කු අනුරුවක් කාලතුවක්කු හමුදා මූලස්ථානයේදී





ඓතිහාසික ලෙව්කේ කාලතුවක්කුවේ අනුරුවක් පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු නිලධාරී නිවස්නය තුළ වර්තමානයේ ස්ථාපිත කොට ඇත. මෙහි විශේෂත්වය වනුයේ ඉපැරණි ලෙව්කේ කාලතුවක්කුවේ හැඩය, දිග පළල හා එහි තිබූ සියුම් කැටයම් පවා ඒ අයුරින්ම නිර්මාණය කොට තිබීමයි. ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ රෙජිමේන්තු අධිපතිව සිටි මේජර් ජෙනරාල් සම්පත් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ගේ උපදෙස් හා මඟපෙන්වීම මත මෙම ඓතිහාසික සංකේතය නිර්මාණය කොට රෙජිමේන්තු පරිශ්‍රයේ තැන්පත් කිරීම ද පසුගිය දිනක සිදු කෙරිණ. අතිශය පෞරාණික වටිනාකමකින් යුතු මෙම කාලතුවක්කු අනුරුව එහි තැන්පත් කිරීම දක්වා සියුම්ව තොරතුරු ගවේෂණය කරමින් සිදුකළ දුෂ්කර කටයුත්තේ සාර්ථකත්වය පිටුපස එම රෙජිමේන්තුවේ මාහි 1 ලුතිනන් කර්නල් ඩීපීඑල්ටී කළුඅග්ගල ආර්එස්පී යූඑස්පී අයිජී ඇතුළු



නිලධාරීන් සහ සෙසුනිලයින් රැසකගේ අසීමිත කැපවීම නොඅඩුව තිබිණ. අභිමානවත් ඉතිහාස උරුමයක වගතුග මතු පරපුරට දායාද කිරීම වස් මෙම කටයුත්තට පුරෝගාමී වූ කාලතුවක්කු හමුදාවේ සැම කදිම ආදර්ශයක්ද සපයා ඇත.



# එක්ව නැගෙමු




සටහන
බ්‍රිගේඩියර් එච්ඩබ්ලිව්පී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
එන්ඩීසී පීඑස්සී
අධ්‍යක්ෂ - මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය


ස්වභාවයෙන්ම සමාන ලක්ෂණ සහිත වුවත් සමාජයීය, ආර්ථික, දේශපාලන, වාර්ගික, භූගෝලීය, ජාතික සහ වෙනත් බොහෝ සමාජ වර්ගීකරණයන්ගෙන් බෙදී ඇති එකම ජීව විශේෂය මිනිසා වේ.

මිනිසා ඈත අතීතයේ පටන්ම විවිධ ජනවර්ගවල හා ජාතීන්ගේ සාමූහික කටයුතු තුළින් බොහෝ ජයග්‍රහණ අත්පත් කරගෙන ඇත. මෙයට දිය හැකි හොඳම උදාහරණය වන්නේ ට්‍රෝජන් යුද්ධයයි. ට්‍රෝජන් යුද්ධයේදී පැහැරගත් හෙලේනා කුමරිය බේරා ගැනීමට ආචියන්ස් *(Achaeans)* විසින් සෙසු කණ්ඩායම් සමඟ දැරූ සාමූහික මෙහෙයුම විජයග්‍රහණයෙන් අවසන් විය.

1948 දී ශ්‍රී ලංකාවේ නිදහස් ව්‍යාපාරයේදී ද යටත් විජිත පාලකයින් පරාජය කිරීමට දිවයිනේ සියලුම ස්වදේශික ප්‍රජාවන් එනම් සිංහල, දෙමළ සහ ශ්‍රී ලංකා මරක්කල ප්‍රජාව ඒකරාශී විය.

මව්බිමට පිළිලයක්ව පැවති *LTTE* ත්‍රස්තවාදය විජයග්‍රාහීව පරාජය කිරීමට 2009 වර්ෂයේදී ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවට හැකිවූයේ සිංහල සොල්දාදුවන්ගේ ඒකායන සහයෙන් පමණක්ම නොවේ. දෙමළ හා ශ්‍රී ලංකා මරක්කල ප්‍රජාව එහිදී දැක්වූ අමිල සහයෝගයද එම යුද ජයග්‍රහණය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන ලදී. හමුදා මෙහෙයුම්වලට අවශ්‍ය තොරතුරු ඒකරාශී කිරීමේදී ඔවුන් ලබා දුන් මෙහෙය මෙහිලා සටහන් කරනු වටී. මෙමඟින් ජනවර්ග අතර ඇතිවූ සහසම්බන්ධතාවය, සන්නද්ධ අරගලය 2009 වර්ෂයේ අවසන් වන තෙක්ම පැවතිණි.

යුද ගැටුම් අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ එම ගැටුම් පැවති ප්‍රදේශවල බොහෝ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වූ අතර, විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රජාතන්ත්‍රවාදී ආචාරධර්ම සමාජීය හා දේශපාලනික මට්ටමින් ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ රජයන් උත්සාහයන් දරා ඇත.

කෙසේ වුවත් නිරායුධ කතෝලික ජනතාව ඉලක්කකොටගෙන සිදුකළ පාස්කු ඉරිදා ප්‍රහාරය තිස් වසරක යුද ගිනිදලු නිවී එකිනෙක ජාතීන් අතර යාන්තමින් දලුලා වැඩෙමින් තිබූ සාමයේ හා සහජීවනයේ අරුණලු සිඳබිඳ දැමීමට සමත්විය. ජාත්‍යන්තර අන්තවාදීන්ගේ අනුග්‍රහය ලැබූ ඇතැම් කණ්ඩායම් රටපුරා බොහෝ අන්තවාදී ක්‍රියා සිදුකළ අතර, සමාජය තුළ විවිධාකාර කල්ලි කණ්ඩායම් ඇති කරමින් සංහිඳියා විරෝධී මතවාද ප්‍රචලිත කරන ලදී. මෙම මතවාද අතර සැකය හා බිය වර්ධනය කරමින් ඔවුනොවුන් අතර එතෙක් දලුලමින් පැවති අන්තර් සම්බන්ධතාවයටද ප්‍රබල හානියක් සිදු කරන ලදී.

අනෙකා කෙරෙහි පවතින "බිය" නමැති ප්‍රධාන මනෝවිද්‍යාත්මක සාධකය වාර්ගික ගැටුම් සඳහා පදනම සපයයි. සියල්ලෝම එක් ජාතියකට අයත් වුවද වාර්ගික, ආගමික හා මතවාදීමය වශයෙන් එකිනෙකා අතර බිය, සැක සහ වෛරය වපුරනු ලැබේ. මෙලෙස අනෙකා කෙරෙහි ඇතිවන බිය නමැති මානසික තත්වය භාෂාව හා ආගම යන කාරණා පදනම් කරගෙන සිදුවේ.

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ප්‍රධාන වශයෙන්ම ජාතික ආරක්ෂාව හමුදාව මත රඳා පැවතිණි. කෙසේ වෙතත් නූතන යුගයේදී ජාතික ආරක්ෂාව, ආර්ථික ආරක්ෂාව, සමාජ සංස්කෘතික

ආරක්ෂාව, තාක්ෂණික ආරක්ෂාව, පාරිසරික ආරක්ෂාව, මානව ආරක්ෂාව, සෞඛ්‍ය ආරක්ෂාව හා හමුදාමය යන සාධකයන්ගෙන් සමන්විත වේ. එසේම සංහිඳියාව නිරන්තරයෙන්ම එකිනෙක ජාතීන් අතර පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මෙහිදී දැඩිව අවධාරණය කෙරිණ. කෙටිකාලීන හෝ දිගුකාලීන සංහිඳියාවක් ඇති කිරීම ආරක්ෂිතව ගුවන් යානයක් ගුවන් ගත කිරීම තරම්ම ප්‍රවේශමෙන් කළ යුතු කාර්යයකි. ජාතීන් අතර සංහිඳියාව ගොඩනැගීම හුදෙක්ම යටිතල පහසුකම් සංවර්ධනයෙන් අත්කරගත නොහැක. සමාජයේ විවිධාකාර බෙදීම් සමනය කරමින් එකිනෙක ගැටෙන ජාතීන්ගේ සිත් රිදවීම් සුවපත් කරමින් විවිධ සිතුම් පැතුම් සහිත ප්‍රජාවන් ගැටුම් වලින් තොරව එක පොදු අවබෝධාත්මක මට්ටමකට ගෙන ඒම අතිශය අභියෝගකාරීය. එනමුත් කෙසේ හෝ සියලු ජනවර්ග අතර සංහිඳියාවක් ඇති කිරීම තුළින් ත්‍රස්තවාදය හෝ පාස්කු ප්‍රහාරය වැනි ගැටුම් නැවත ඇතිවීම වළක්වාගත හැක.



ආරම්භයන් සහ පාලන ක්‍රම අනුව එකිනෙකට වෙනස් ලෙස බෙදී පවතී. ශ්‍රී ලංකාවේ තත්වයද ආසියාවේ සෙසු රටවල් මෙන්ම වෙනස් නොවන අතර ශ්‍රී ලංකාව තුළ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා භාවිතා කළ යුතු ප්‍රධාන සංරචකයක් ලෙස මෙම ජන විවිධත්වය භාවිතා කළ හැකිය. සියලු ජනතාවට අත්විඳිය හැකි ජාතික සංහිඳියාවක් ඇති කිරීම උදෙසා ආර්ථික, සමාජ සහ මනෝවිද්‍යාත්මක සංරචකයන් අවශ්‍ය වන බව පෙන්වාදිය හැකිය. එසේම, ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් භාවිත කරන භාෂාවන් ආගම් හා ඔවුන්ගේ සංස්කෘතීන්ට සමාන වැදගත්කමක් ලබා දීම මෙහිලා වැදගත් වේ.

බිය නමැති මානසික සාධකය ඕනෑම ගැටුමකට මූලික වේ. විශේෂයෙන්ම මෙහිදී අනෙකා කෙරෙහි ඇතිවන බිය ජනවර්ග අතර ගැටුමකට මඟ පාදයි. එක් ජාතියකට අයත්ය යන හැඟීම තුළින් අනෙකා කෙරෙහි ඇතිවන බිය නමැති සාධකය සමනය කළ හැකිය. එසේම, මෙමඟින් විවිධ ආගමික, වාර්ගික හා මතවාදීමය යන කරුණු පදනම් කරගෙන එකිනෙකා අතර බිය හා සැකය වර්ධනයවී එය පසුකාලීනව ව්‍යාප්ත විය හැකිය. මෙම ව්‍යාජ මානසිකත්වයන් ගොඩනැංවීම සඳහා වෛරී ප්‍රකාශ ඇතුළු වාග් ප්‍රහාර ප්‍රබල බලපෑමක් සිදුකරනු ලබන අතර, එමඟින් එම පුද්ගලයන් එකිනෙක කාණ්ඩවලට බෙදා නූතන, දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය තුළින් ජන වර්ගවල ඇතිවන මෙම බෙදීම් තහවුරු කරනු ලැබේ.



බැරි බූසාන් *(Barry Buzan)* ජාතිකත්වයට ඇතිවන බාධාවන් හඳුනාගනිමින් ජාතික ආරක්ෂාව ගොඩනැගීම හෝ විනාශ කිරීම සඳහා වාග් ප්‍රහාරයන්ගේ (*RHETORIC*) භාවිතාවය ප්‍රබල බලපෑමක් සිදුකරන බවට දක්වා තිබේ. එසේම, එකිනෙක ජාතීන් අතර සාමය හා සංහිඳියාව ඇති කිරීම ද කළ හැක.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව අත්විඳි වාග් ප්‍රහාරයන් එක්තරා ජන සමාජයක ප්‍රචණ්ඩකාරී සුළු ප්‍රමාණයකගේ අගතිගාමී ක්‍රියාකාරකම් නිසා ඇතිවූවකි. නූතන තාක්ෂණික පහසුකම් හා සමාජ මාධ්‍ය වෛරී හැඟීම් වඩ වඩාත් බල ගන්වා එකිනෙක ජනවර්ග අතර, අසමඟිය වර්ධනය කරමින් බෙදා හරින ලදී.

ආසියාතු කලාපයේ පිහිටා ඇති ශ්‍රී ලංකාව සමීප භූ විෂමතාවයන් සහිත වුවත් භාෂාව, සංස්කෘතිය, ආගම, ශිෂ්ඨාචාරමය

මහනුවර දළදා මාලිගාව, ශ්‍රීපාදස්ථානය, කතරගම පූදබිම, කච්චතිව් ශාන්ත අන්තෝනි මුණිදුන්ගේ පල්ලිය, කොච්චිකඩේ ශාන්ත අන්තෝනි පල්ලිය, මෝදර කාලිඅම්මාන් කෝවිල යනාදී ස්ථාන විවිධ ජන වර්ග අතර සංහිඳියාව ඇති කිරීම සඳහා යොදාගත හැකි ආගමික ස්ථාන වේ. මෙම විවිධත්වය මත ගොඩනැගුණු ආගමික සිද්ධස්ථාන ආශ්‍රිත උත්සව සඳහා ප්‍රධාන ස්ථානයක් ලබාදිය යුතු වන්නේ විවිධත්වය තුළින් ඒකීයත්වය කරා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සැකසෙන හෙයිනි.

ටුටු *(TUTU, 2003)* ප්‍රකාශකරන ආකාරයට වේදනාකාරී අතීතය සිහිකිරීම, ඒ පිළිබඳ දැනුවත් කිරීම සහ අවබෝධ කර ගැනීම තුළින් එය යළි සිදුනොවීමට ජනතාව පෙළඹවීම එවැනි අභාග්‍ය සම්පන්න සංසිද්ධි නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ගත හැකි හොඳම ක්‍රියාමාර්ගය වේ.

එකිනෙක වාර්ගික කණ්ඩායම් අතර භීතිය වපුරන ආවේග කාරී වාග් ප්‍රකාශයන් තුළින් ඇතිවන බෙදීම් හරහා ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව තවදුරටත් තර්ජනයකට ලක් නොවිය යුතුය. එසේම, එකිනෙකා අතර සුහදතාව වර්ධනය කිරීම තුළින් එකිනෙක ජාතීන් අතර සංහිඳියාව හා අන්‍යෝන්‍ය අවබෝධය ඇතිකළ යුතුය. මෙලෙස ඇතිවන ප්‍රචණ්ඩ වාග් ප්‍රහාරයන් හා එකිනෙක ජනවර්ග අතර ඇතිවන බිය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව කවර කලෙකත් අභියෝගයට ලක් නොවිය යුතුය. එසේම එය සෑම මොහොතකම ශ්‍රී ලංකාවේ අභිවෘද්ධිය අපේක්ෂා කරන ජනතාවගේ පරම වගකීම විය යුත්තේය.

# පාසල් දරු දැරියන්ගේ අධ්‍යාපනයට අත්වැලක්



පසුගියදාට යෙදුණු තෛපොංගල් දිනට සමගාමීව 521 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්එම් සල්වතුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණයෙන් උඩුප්පිඩ්ඩි බාලිකා විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුවියන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීම සඳහා රුකුලක් වෙමින් සිසුවියන් 50 දෙනකුට පාසල් පාවහන් ප්‍රදානය කිරීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක් පැවැත්විණ. 52 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජීජීඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එච්ඩීඑම්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 13 වන දින පැවති මෙම ප්‍රජාසත්කාරක වැඩසටහන සඳහා 521 වන පාබල බලසේනාවේ නිලධාරීන් සහ සෙසු නිලයන් මෙන්ම අච්චුවේලි ප්‍රදේශයේ වෙළඳ ව්‍යාපාරික මහතුන් විසින් මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබූහ. එම අවස්ථාවට උතුරු පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, ආරක්ෂක සේනා (යාපනය) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී, 521 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීන් හා යුද්ධ හමුදා සාමාජිකයින් පිරිසක් එක්වූහ.



# 15 වසරක අභිමානය සමරමින්

4 (සෙව) ශ්‍රීලයුයුබ 15 වන සංවත්සරය 2022 ජනවාරි මස 09 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්එම්එස්එම්බී වන්සේකර ඒඒටීම් ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ වැඩසටහන් රැසක් සංවිධානය කර තිබුණි. ඒ අතර නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ බෝධිපූජා පිංකමක් පැවැත්වීම, අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් පිරිනැමීම, අභිනව ආයුධාගාරය, මුරහල හා බත්/සැර නිවස්න භෝජනාගාරය සහ විසන්ත කාමර ගොඩනැගිල්ල විවෘත කිරීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය ආදී කටයුතු කැපීපෙනුනි. එමෙන්ම සංවත්සරයට සමගාමීව සියලු නිලයන්ගේ සහභාගීත්වයෙන් ලේ දන්දීමේ වැඩසටහනක්ද පවත්වන ලදී.



# ජන දිවියට අත්වැලක්



641 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීපීජේසී ජයවර්ධන යූඑස්පී ගේ අධීක්ෂණය මත එම බලසේනාව යටතේ පාලනය වන 14 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ඒකක බලප්‍රදේශයට අයත් මණ්නන්කන්ඩාල් ග්‍රාමසේවා වසමේ තෝරාගත් දිළිඳු පවුල් 51 ක් සඳහා පැළ වර්ග බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 16 වන දින පැවැත්විණ.

එහිදී පොල්, කජු සහ කොස් පැළ බෙදාදුන් අතර, මෙම වැඩසටහන සඳහා 641 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී, 14 වන ශ්‍රීලංසිරෙ අණදෙන නිලධාරී, රාජ්‍ය නිලධාරීන් හා යුද්ධ හමුදා සාමාජිකයන් රැසක් සහභාගී වූහ.

# ඉංජිනේරු සේවා බලකායේ අභිමානවත් 72 වන සංවත්සරය





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු සේවා බලකාය 2022 ජනවාරි 10 වන දින සිය අභිමානවත් 72 වන සංවත්සරය සැමරීය. ඊට සමගාමීව ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් හමුදා සම්ප්‍රදායානුකූල වැඩසටහන් රැසක් සංවිධානය කර තිබිණ. අධ්‍යක්ෂ ඉංජිනේරු සේවා සහ කර්නල් සේනාවිධායක බ්‍රිගේඩියර් කේඑම්එස් කුමාර ගේ ප්‍රධානත්වයෙන් පැවති එම සංවත්සර කටයුතුවලට මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් සෙසු නිලයන් රැසක් සහභාගී වූහ.

# බාධක තරණයට එක්වෙමින්







59 වන පාබල සේනාංකයේ 14 වන සංවත්සරයට සමගාමීව 19 වන ගැමුණු හේවා බලකාය සහ 5(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ අන්තර් පාබල බලසේනා සහ ඒකක බාධක තරණය කිරීමේ තරඟය ඉකුත් දෙසැම්බර් 06 වන දින 2 වන විශේෂ බලකා කඳවුරේදී පැවැත්විණ. එම අවස්ථාව සඳහා 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබංඩාර යූඑස්පී, 593 වන පාබල බලසේනාධිපති, අණදෙන නිලධාරීවරු ඇතුළු පිරිසක් සහභාගි වූහ. 19 වන ගැමුණු හේවා බලකාය එහි ශූරතාවය දිනාගත් අතර, අනුශූරතාවය 5(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් හිමිකර ගන්නා ලදී.

# සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක්



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බල ප්‍රදේශයේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ක්‍රීඩා හැකියාවන් ඉහළ නැංවීමේ අරමුණින් සංවිධානය කෙරුණු සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් ඉකුත් දෙසැම්බර් 20 වන දින 3 විජයබාහු පාබල රෙජිමේන්තු ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. 681 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ පූර්ණ අධීක්ෂණයෙන් යුතුව පැවැත්වුණු මෙම ක්‍රිකට් තරඟාවලියට 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේආර්කේකේපී බංඩාර ආර්එස්පී යූඑස්පී ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය.



# සෙනෙහෙ කොළයක

# පලහිලව්වක්

මාධ්‍ය නිදහස ගැන කවුරුවත් මහ ලොකුවට කතා කළාට අපේ ගෙදර නම් මට එරෙහිව පවතිනුයේ දැඩි හා අසාධාරණ ප්‍රවෘත්ති පාලනයකි. ඒ මා දැන් ඉලන්දාරි වයසේ පසුවන බැවිනි. අප්පච්චි හා අම්මා සිතා සිටින්නේ ලෝකේ සියලුම කෙල්ලන් සැරසී සිටින්නේ මා අල්ලා ගැනීමට කියාය.

මේ පදනම මත මා ප්‍රේම සම්බන්ධතාවකට පැටලෙතැයි බියෙන් අම්මා ගේ අනුමැතියද ඇතිව අප්පච්චි පනවා ඇති ප්‍රවෘත්ති පාලනය අනුව නමට එන ලියුම්ද මා තැපැලට දමන ලියුම්ද ඔවුන් දෙදෙනාගෙන් කවරකු හෝ ඇසට හා අනුමැතියට ලක්විය යුතුය.

මේ දෙන්නාටම කොළේ වසා කෙල්ලන් සමඟ ලිපි ගනුදෙනු කරන මා ඔවුන්ගේ ලිපි ලබා ගන්නේ මගේ මිතුරකුගේ ලිපිනයටය. මා කෙල්ලන්ට ගෙදර සිට ලිපි ලියන්නේ පත්තරේට ලිපි ලියන බවක් පෙනී යන පරිදි පොත්පත් හා ලිපිගොනු කිහිපයක් ඉදිරියෙන් තබා ගෙනය. ඉදින් යම් කෙල්ලකට මාගේ ගෙදර ලිපිනයට ලියුම් ලිවිය යුතු නම්, ඒ සඳහා මාගේ පාසලේ විදුහල්පති කාර්යාලයෙන් මා හොරෙන් ලබා ගත් "රාජ්‍ය සේවය පිණිසයි" සඳහන් ලියුම් කවර මා ඔවුනට සපයා ඇත. මගේ ගෙදර බලධාරීහු රජයේ ලියුම් නොකඩති.

මෙසේ ගෙදර සතුරු කරදරවලින් බේරී තැපැල් මාර්ගයෙන් ප්‍රේම රාජ්‍යයේ කුමාර ලීලාවෙන් පසුවෙමින් යථා කල්හි අභිෂේක ලැබීමට පෙරුම් පුරමින් සිටි මා පසුගිය දිනක මගේ පිය රාජෝත්තමයාණන් වහන්සේ ස්නානය කරමින් සිටියදී, එම අවසරයෙන් මගේ අලුත්ම පෙම්වතියට රස වැහෙන පෙම් ලිපියක් ලියා එය තැපැල් කිරීමට ලියුම් කවරයක් සෙවූ මුත්, කවර සියල්ලම අවසන් බව පෙනී ගියේය. අහෝ! ප්‍රේමයට බාධා නැත්තේ කොහෙද?

ලියූ ලියුම සාක්කුවේ දමා, තැපැල් කාර්යාලයෙන් මුද්දර කවරයක් මිලදී ගෙන එයට බහා ලියුම තැපැල් කරන අටියෙන් මම හතර වටේටම සූක්ෂම සෝදිසියක් යොමුකර පාරට බැස්සෙමි.

මහා අභිනිෂ්ක්‍රමණයේදී සිදුහත් කුමරුට වසවර්ති මාරයා හමුවූ පරිදි, මගේ පියාණෝ මහ මඟදී මට හමුවූහ. පියාණන් වහන්සේ මා දෙස මාර බැල්මක් හෙළූ සේක. මටද මාර ජුවල් ගියේය. හතුරාගෙන් ප්‍රහාරය එල්ල වීමට පෙර තමා පළමුවෙන් පහර එල්ල කිරීමේ යුද උපක්‍රම දත් මම පියාගෙන් ප්‍රශ්නයක් එල්ලවීමට පෙර "අප්පච්චි කොහේ යන ගමන්ද?" කියා ඇසිමි.

"මං මේ ගොනා නාවලා ඇඟපත හෝදාගෙන කරන්න කාරයා නාවේ මොකද බලන්න කියල පාර පැත්තේ යන්නද නොයන්නද කියලා" අප්පච්චි සරම ලාවට පස්ස පැත්තෙන් ඔසවාගෙන අජටාකාශයට දුම් එල්ලවන පරිදි සුරුට්ටුව උරන්නට විය. "ම්... තෝ කොහේද බොල?"

"මං මේ අප්පච්චි..." මම බොරු හේතුවක් සෙවීමට උත්සාහ කළෙමි.

"රස්තියාදු ගහන්නද පාරේ" පළමු සෝඩා වතුර උගුරට පසු මුඛයෙන් පිට වූ සුරුට්ටු මිශ්‍රිත වාග් ප්‍රහාරයෙන් මම අන්දමන්ද වී භ්‍රමණය වීමට පටන් ගත්තෙමි.

"නෑ..."

"එහෙනම්..."

"මේ මේ ලියුමක් තැපැල් කරන්න..." බිය වැඩි වූ විට අසත්‍ය අප කරා ඒමට ප්‍රමාද වෙයි. එවිට නිරායාසයෙන්ම කියවෙන්නේ ඇත්තය.

"කාටද...?"

"මේ..."

"ඔව්...."

"පත්තරේට..."

"පත්තරේට...?"

"ඔව් අප්පච්චි..."

"මේ පාර මොන කෙංගෙඩියද ලිව්වේ...? තෝ මේ පාරත් මාට...?"

"නෑ අප්පච්චි... අප්පච්චි ගැන මොනට ලියන්නද? මෙච්චර විකාර තියෙද්දී..."

"මට විශ්වාස නෑ..."

"නෑ ඇත්තමයි... මං ගිහිල්ලා තැපැල් කරල එන්නං..."

"ම්... පලයං..".

රිමාන්ඩ් භාරයේ සිට ඇප පිට නිදහස් කර හරින ලද්දකු සේ මම අඩියට දෙකට පැන්නෙමි.

"ඔහොම හිටු!" හමුදා මුර පොළකින් ඇසෙන නතරවීමේ අණක් ලෙස පියාගේ හඬ මට ඇසිණ.

"ඇයි අප්පච්චී...?"

"මමත් මේ තැපැල් කන්තෝරුවෙ පැත්තට යනවා. දීපිය ලියුම මං තැපැල් කරන්නං..."

"නෑ අප්පච්චි මහන්සි වෙන්ට ඕනෙ නෑ..."

"මොකද බොල මහන්සිය, තොගෙ ලියුම ගජබා රජ්ජුරුවන්ගේ යගදායවත් වැඩිය බරද...? කෝ දීපං..."

"නෑ අප්පච්චී..." මම ඇඹරුණෙමි.

"දෙන්නෙක් මහන්සි වෙන්න ඕනෙ නෑ... මං කරත්ත ජේම්සා හොයාගෙන යන එක, තැපැල් කරගෙනම යන්නං. කෝ..." අප්පච්චිගේ අත මා වෙත දිගු වූයේ බයිනෙත්තුවක් සේය.

"නෑ අප්පච්චී... මේකට ඇන්විලොප් එකකුත් අරගෙන ඇඩ්‍රස් එක ලියලා, මුද්දරයකුත් ගහලා යවන්න තියෙන හන්දයි මම යන්න ලෑස්ති..."

"මං ඒවා ඔක්කොම කරන්නං..."

ඇඩ්‍රස් එක ටිකක් දිගට ලියන්ඩ තියෙනවා...

"මොකක්ද...?"

"මට මතක හැටියට මේ... මේ..."

"තොට අමාරු වුණාට බොල, මට හොඳට මතකයි පත්තර කන්තෝරුවෙ ඇඩ්‍රස් එක..."

"හරි... ඒ වුණාට අප්පච්චී, මගෙ හිතේ රෙජිස්ටර් කරල යවන්ඩ..."

"ඕක මහ රටාවක්යෑ... මං ඒකත් කරන්නං..."

"සල්ලි..."

"තොගෙ හිතේ මට දොළහයි පණහක් නෑ කියලද උලමෝ...? අනික, උඹ තමා රෙජිස්ටර් කරල යවන මිනිහා... පුළුවන් නං මුද්දරේ ගහන්නෙත් නැතුව යවයි... මං නොදන්නවායෑ මගේ පුත්‍ර රත්නයගෙ හැටි... ගස් ගෝනා..."

"නෑ... මං හෙට තැපැල් කරන්නං..."

"නෑ නෑ... අද කළ යුතු දේ හෙටට කල් නොදමනු කියල තියෙනව නේද මීහරකො... තෝ පල ගෙදර... මං ඔක්කොම කරන්නං... කෝ..." අප්පච්චී මගේ කමිස සාක්කුවට අත යවා ලියුම ඩැහැගත්තේ කොකකු මාළු ඩැහැගන්නා අයුරිනි. කාලගෝලයාගෙන් දික්නලාව ඩැහැගත් දික්පිටියා සේ මගේ කමිස සාක්කුවේ වූ මා ප්‍රිය පෙම්වතිය අමතන ලද මගේ පෙම් ලියුම ඩැහැගත් මගේ අප්පච්චී පාර දිගේ ඉදිරියට ගියේ එය දිගහැර බල බලාය. පොළාවේ ගසන ලද බඹරයක් සේ කැරකි කැරකී මම ගෙදර අවුත් යහනේ වැතිරුණෙමි. මගේ ජීවිතේ අවසානය අදද...?

"මේ ඇහුණද...?" අප්පච්චි අම්මා අමතනු අසා මම කල්පනා ලෝකයෙන් චුත වූණෙමි.

"ඇයි මොකද...?" කියා අම්මා ඉස්තෝප්පුවට ආ පසු, ගෙට ගොඩ වූ අප්පච්චී ඇයද සමඟ මගේ කාමරයට ඇතුළු විය.

"ඔහොම වාඩිවෙයං..."

පියාගේ අණින් මැණියෝ මගේ ඇඳේ වාඩි වූයෝය. පියාණෝ අසල පුටුවේ වාඩි වී මා වෙත මාරාන්තික බැල්මක් හෙළුවෝය.

"මගේ පෙම් පිඬ... තූ නොදකිං මේ මිනිහගෙ තියෙන මනමාලකම..." අම්මා ඇඳෙන් නැගිට්ටාය.

"ඔහොම ඉන්නවා..." අප්පච්චී අම්මා නතර කළේය.

"මං මේ කියන්නෙ උඹේ පුත්තර රත්නය කෙල්ලෙකුට ලියපු ලියුම ආරම්භ කරල තියෙන මුල් ආමන්ත්‍රණය... ඕං අහගනිං..." මගේ පෙම් පිඬ, සුදූ, ඔබ මට රන් ආකරයකි. මැණික් පතලකි. ඔබේ අත ගෙන ලෝකය වටේ යන්නට ඇත්නම් ඊට වඩා සැපතක් මට නැත. ෆාදර්කාරයාගේ දේපොළ මගේ නමට ලියාදෙන තෙක් අප ආදරය කර කර ඉමු... "ජේනවා නේද මේ ගස් ගෝනා... කියන්න... කියන්න..." අම්මා වෙලි නාට්‍ය තරඹන තරම් උනන්දුවක් දැක්වූවාය. මම වහලේ පරාල සහ රීප්පද, සිංහල උළු කැටද ගණින්නට වූයෙමි. තඩි මීයෙක් මට ඔච්චම් කර රීප්පයක් දිගේ ඇදී ගියේය.

**මහා අභිනික්මණයේදී සිදුහත් කුමරුට වසවර්ති මාරයා හමුවූ පරිදි, මගේ පියාණෝ මහ මගදී මට හමු වූහ. පියාණන් වහන්සේ මා දෙස මාර බැල්මක් හෙළු සේක. මට ද මාර ජුවල් ගියේය.**

"ඔව් ප්‍රේමිය... ස්විට්සර්ලන්තයට ගොස් එහි ගීත දේශගුණය මැද අපේ සුන්දර ප්‍රේමයේ..." තාත්තා නතර වූයේය.

"මං වතුර ටිකක් බීලා එන්නම් මූට හොඳ ගීතල දේශගුණයක් දෙන්න..." කියා තාත්තා කාමරයෙන් පිට වූයේය. ඒ අවසරයෙන් මම පෑන අතට ගෙන ලිපිය අගට තවත් වචන කිහිපයක් එකතු කළෙමි.


තාත්තා උගුරේ රැල් බුරුල් හරිමින් කාමරයට ඇතුල්විය. "ඔය ලියුම ලිව්වට මගෙ පුතා වැඩිදුර ඔය සම්බන්දෙ ගෙන යන එකක් නෑ..." කියමින් අම්මාද කාමරයට ඇතුළු වූවාය.

"බලමු..." කියා තාත්තා ඉන්පසු මුණු මුණු ගා කියවිය.

"මීට... ඔබේ පෙම්වතා.... ආ... තවත් මොනවද මේ යටින් ලියල තියෙන්නේ...? කතුතුමණි, මෙම පෙම් ලිපිය ඔබේ පුවත්පතේ විහිළු පිටුවේ පළ කරන්න...!" යැයි තාත්තා අවසාන වශයෙන් කියවූයේ ඔහු වතුර බොන්න කාමරයෙන් පිටවූ විගස මා ලියූ වචන ටිකය.

"ඒක මිසක්... මේ පත්තරේට ලියපු ලියුමක් නෙ... ඔයා මේ පොට වරද්දගෙන... මගේ එකා ඔය කෙල්ලන්ට ලියුම් ලියන නොසන්ඩාල එකෙක් නොවෙයි කියල මං දන්නවනෙ..." අම්මා මගේ හිස අතගෑවාය. තාත්තා අකුළාගෙන කාමරයෙන් පිටවිය.

චන්ද්‍රා අතබිරන්නගේ
"තරලොව තොල්මන්" කෘතිය ඇසුරෙනි



# අර්බුදයකදී කෙසේ හැසිරිය යුතුද?

දිනක් පිහිනුම් තටාකයක් ළඟ සිටියදී මට කලබලයක් ඇසුණි. තටාකයේ ගැඹුරුම තැන මිනිස් හිසක් උඩ යට යමින් තිබුණේය. තටාකය ළඟට දිවගිය එක් පුද්ගලයෙක් "හුස්ම අල්ලාගෙන ඉන්න. හුස්ම අල්ලාගෙන ඉන්න" යනුවෙන් කෑ ගසන්නට විය.

එතැනට දිවගිය තරුණියක් "පිට පැත්තට පෙරළී පාවෙන්න" යනුවෙන් කෑ ගැසුවාය. ඔවුන් නැගූ හඬ ඇසුණු එම තටාකයෙහි සේවය කරන ජීවිතාරක්‍ෂක නිලධරයා එතැනට දුව අවුත් ජල තටාකය තුළට පැන එහි ගිලෙමින් සිටි තැනැත්තා ඉතා දක්‍ෂ ලෙස ගොඩට ඇද ගත්තේය. පසුව එම නිලධරයා හා අමතා මෙසේ කීය.

"කවුරු හරි උදව් ඉල්ලා කෑ ගැසුවේ නැත්තේ මොන ඉලව්වකටද? කවුරු හරි දියේ ගිලෙමින් සිටියදී ඔහුට පිහිනුම් කලාව උගැන්විය හැකිද?"

සති කිහිපයකට පසු මා පාසල් භෝජනාගාරයක සිටියදී ඒ කියමන ක්‍ෂණයෙන් මතක් විය. කිරි බඳුනක් මිලට ගත් කුඩා දැරියක් මේසයක් ළඟට එමින් සිටියදී එය ඉහිරුණි. එතැන හුන් ගුරුවරියක් කළේ නොසැලකිලිමත් බව ගැන දැරියට බැන වැදීමය. තව පාසල් දැරියෝ කීප දෙනෙක් ඇයට විහිළු කළහ. පරාජිත හැඟීමකින් ඇලී ගිය දැරිය නිහඬව නිසලව එතැනම හුන්නාය.

පිහිනුම් තටාකයේ නිලධරයාගේ වචන සිහිපත් වූ මා නිගමනය කළේ අර කිරි බඳුන ඇගේ දිවා ආහාරය වන්නට ඇති බවත්, තව කිරි බඳුනක් ගැනීමට තරම් තමන් ළඟ මුදල් නැති නිසා ඇය දුකට පත්වී ඇති බවත්ය. මම වහාම කිරි බඳුනක් මිලටගෙන ඇය අත තැබීමි. දැරිය මා වෙත හෙළූ සැනසිලිදායක හා ස්තුතිපූර්වක බැල්මෙන් ඔප්පු වූයේ මගේ නිගමනය නිවැරදි බවය.

අර්බුදකාරී අවස්ථාවක අප ක්‍රියා කළ යුත්තේ වැඩදායක ආකාරයෙනි. සහෝදර මනුෂ්‍යයකු කරදරයකට පත්වී සිටින විට ඥානවන්ත ලෙස හා කාර්යක්‍ෂම ලෙස ක්‍රියා කිරීමට අප උත්සාහ කළ යුතුය.

ඉකුත් නත්තල් සමයේ මහජනයාට අහර බඳුන් බෙදමින් සිටි කතුන් පිරිසක් සමඟ මගේ මිතුරියක්ද සිටින බැව් මට දිස්විය. එක් නිවසක් ළඟදී කුඩා දරු පිරිසක් සමඟ කාන්තා කණ්ඩායම වෙත පැමිණි මවක් හිස සලමින් කොඳුරා සිටියේ ඇයට අර අහර බඳුන් අනවශ්‍ය බවය. කෝපයට පත් කාන්තා පිරිස නිගමනය කළේ ඒ මව අහංකාරකම උඩ එසේ කළ බවය. පසුව මගේ මිතුරිය මෙසේ කීවාය.

"එදා ඒ මවගේ නිවස අතහැර අප කණ්ඩායම ඉවත යද්දී මට යමක් සිතුණු හෙයින් මම තනියම ඇගේ නිවසට ආවෙ. ගෑස් ලිපේ ගෑස් හමාර නිසා ගෙයි ඇති කළුකුම් ගඳ උහුලාගත නොහැකි බැවින් එය වෙන කාටහරි තෑගි කළ යුතු යැයි මට දරුවන් අමතා කියනු මට ඇසුණි. මා කළේ කළුකුම් මළකඳ අපේ ගෙදරට ගෙන ගොස් එය උයාගෙන ආපසු ඔවුන්ට ගෙනත් දීමය"

අර්බුදකාරී අවස්ථාවකදී කෙනකුට පිහිට විය හැක්කේ තමන්ගේ සුගතියට වඩා අනුන්ගේ සුගතිය ගැන සැලකිලිමත් වීමෙනි. සමහර අර්බුදවලදී අප විශේෂඥකම් කිරීමට යත්න නොදරා නියම විශේෂඥයකු කැඳවීම වඩා ඥානාන්විතය. අප ගතයුතු පියවර පමා කළ යුතු අවස්ථාවන්ද නැත්තේ නොවේ.

"මා දන්නා හඳුනන පූජකවරයෙක් වරක් තමන්ට මස් සපයන මස් මුදලාලි කෙනකු සමග ඉතා කිට්ටු සම්බන්ධයක් ඇතිකර ගත්තේය. ඔහු මස් ගෙනා සෑම අවස්ථාවකදීම මා සහ ඔහු අතර දිගින් දිගටම කතාබහ ඇතිවුණා. ඒ වගේම අපි දෙන්නා මාළු අල්ලන්න එකට යන්න පුරුදුව සිටියා. ඔහු මත්පැන් වලට ඇබ්බැහි වූ පුද්ගලයකු බව මා දැන සිටියා. නමුත් ඒ ගැන මා ඔහුට මුකුත් කීවෙ නෑ" යි පූජකතුමා කීවේය.

මස් මුදලාලිගේ පවුලේ අය සහ මිත්‍රයන් කීප වතාවක් අධික ලෙස මත්පැන් බීමේ ඇති විපාක ගැන ඔහුට පැහැදිලි කර දී ඇති මුත්, ඉන් කිසිදු ඵලක් වී නැත. මුදලාලි මත්පැනින් මුදාගනු සඳහා උදවු වන ලෙස

ඔවුන් අන්තිමේදී පූජකතුමාගෙන් ඉල්ලා ඇත. එහෙත් මස් මුදලාලි සමඟ ඔහුගේ මත්පැන් ලෝලත්වය ගැන කිසිවක් කතා නොකළ පූජකතුමා ඔහුට හැඳින්වූයේ තමා ඔහු ගැන සැලකිල්ලක් දක්වන්නේ මනුෂ්‍යයකු වශයෙන් පමණක් බවය.

දිනක් කඳුළු පෙරාගෙන පූජකතුමා වෙත දිව ආ මස් මුදලාලි ඔහු අමතා මෙසේ කීය.

"මේ දැන් මගේ පුතා මට කිව්වා එයාට ඉවසන්න බැරි කාරණා දෙකක් තියෙනව කියල. ඒ තමා තෙම්බිච්ච බල්ලයි වෙරි කාරයයිලු. දෙන්නම උහුලන්න බැරි තරම් ගඳ ගහනවලු. කරුණාකරල තමුන්නාන්සෙ ගඳ ගහන වෙරිකාරයට උදව් වෙනවද?"

මේ තීරණාත්මක අවස්ථාව එළඹෙන තුරු පූජකතුමා දිගු කලක් ඉවසා සිට ඇත. උන්වහන්සේ මනෝ විද්‍යාඥයකුගේ සහ මධ්‍යසාර විරෝධී සංගමයේ පිහිට පැතුවේය.

මස් මුදලාලි මත්පැනින් වැළකිලා දැනට අවුරුදු පහළොවක් වෙනවා. ඔහු මධ්‍යසාර ප්‍රශ්නය උඩ අන් කිසි කෙනකු ළඟට නොගොස් මා ළඟටම ආවේ මන්දැයි දිනක් මා ඔහුගෙන් ප්‍රශ්න කළා. ඔහු කියා සිටියේ ඔහුට ඒ ප්‍රශ්නය උඩ කරදර කළ එකම මිනිසා මා බවයි. පූජකතුමා මා අමතා කීය.

මිනිසුන්ට කරදරවලදී, අර්බුදවලදී, බාධාවලදී උදව් කරන ආකාරය ගැන ස්ථිර ක්‍රමයක් හෝ එකම ක්‍රමයක් නැත්තේය. විපතට හෝ කරදරයට පත් මිනිසකුට උපකාර විය යුත්තේ කෙබඳු විදියකට දැයි නිගමනය කළ හැක්කේ අවස්ථාව හා පුද්ගලයා අනුවය. එබඳු තැනකදී ඔබ ප්‍රඥාවන්ත ලෙස ක්‍රියා නොකළහොත් ඔබ කරනුයේ ඒ තැනැත්තාට තිබෙන කරදර මදිවාට තව කරදරයක් එකතු කිරීමය.

# රට රකින්නට තරුණ ජවය





*Army Way Foward Strategy* 2022 - 2025 ට අනුව යුද්ධ හමුදාවේ අනාගත අභියෝගයන්ට මුහුණදීම සඳහා ශාරීරිකව, මානසිකව හා සදාචාරාත්මකව ශක්තිමත් වෘත්තීය සෙබළුන් බිහිකිරීමේ අරමුණු ඇතිව දිවයිනේ සියලුම ප්‍රදේශවලින් බඳවා ගන්නා ලද දමිළ, මුස්ලිම් සහ සිංහල තරුණයන් 360 දෙනකුගේ මූලික පුහුණුවීම් බලඇණි පුහුණු පාසල වාසවිලාන් හිදී ඉකුත් දෙසැම්බර් 13 වන දින ආරම්භ කරන ලදී. මෙම ආධුනික පුහුණු පාඨමාලාවේ ආරම්භක දේශනය 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින් සිදුකළ අතර, 511, 512 සහ 515 යන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, බලඇණි පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.

# පන්තිකාමර ගොඩනැගිල්ලක් සිසු අයිතියට



1 වන ශ්‍රී ලංකා රයිෆල් බලකායේ අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ *Agility Logistics* සමාගමේ මූල්‍ය දායකත්වයෙන් සහ ගම්වාසීන්ගේ ශ්‍රම දායකත්වයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මප/තෙල්/රඹුක්වැල්ල කණිෂ්ඨ විද්‍යාලයේ ඉදිකරන ලද පරිගණක ඒකකයකින් සමන්විත පන්ති කාමර ගොඩනැගිල්ලක් ඉකුත් දෙසැම්බර් 18 වන දින විවෘත කෙරිණ. එම උත්සවය සඳහා 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑස්කේ සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ 111 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීඑම්ආර්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ප්‍රධාන අමුත්තන් ලෙස එක්වූහ.

# දිස්ත්‍රික් රණවිරු සංවිධාන නිලධාරීන්ගේ හමුවක්

ශ්‍රී ලංකාවේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් අති විශිෂ්ට සේවාවක් ඉටුකොට මියගිය යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ළඟම ඥාතීන් හා විශ්‍රාම ගොස් සිටින යුද්ධ හමුදා සාමාජිකයන් හට අභිමානවත් ලෙස නිසි ගෞරවයක් හා පිළිගැනීමක් සහිතව ජීවත්වීම සඳහා අවකාශය හා පරිසරය ගොඩනැගීම වස්, ආසේමු බලප්‍රදේශ යටතේ දිස්ත්‍රික් වශයෙන් ඔවුන් සංවිධානය කිරීමේ වැඩසටහනක් ආරම්භ කෙරිණ. යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයක් අනුව රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධතාවයෙන් යුතුව මෙම දිස්ත්‍රික් රණවිරු සංවිධාන ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.



රණවිරු සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එම් මායාදුන්න ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් යුතුව රණවිරු සංවිධානයන්හි ඉදිරි අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඹැඳි මෙම හමුව 2021 දෙසැම්බර් මස 28 වන දින 61 වන පාසේමු හිදී පවත්වන ලදී. මේ සඳහා ආසේමු (බටහිර) ට අයත් කළුතර, ගාල්ල, මාතර සහ ආසේමු (මධ්‍යම) ට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයන් හි අධීක්ෂණ නිලධාරීන්, රණවිරු සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික තනතුර හොබවන නිලධාරීන් මෙන්ම දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් සහ රණවිරු සංවිධාන ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් පිරිසක් ද සහභාගී වූහ.

# බලඇණි පුහුණු පාඨමාලාවේ දේශනයක්



57 වන පාබල සේනාංකය යටතේ පාලනය වන අම්පකාමම් බලඇණි පුහුණු පාසලේ 9 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව මේ වන විට සිය බලඇණි පුහුණු පාඨමාලාව හදාරනු ලබයි. ඊට නිලධාරීන් 07 ක් සහ සෙසුනිලයන් 336 දෙනකු ඇතුළත්ව සිටිති. එම පාඨමාලාවේ මානව හිමිකම් හා මානුෂවාදී නීතිය පිළිබඳ හරවත් දේශනයක් ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බ්‍රිගේඩියර් එම්ටීකේආර් සිල්වා කේඑස්පී විසින් සිදුකරන ලදී.

# විරුවන් සමරන අභිමන් තැනක්



අල්ල, කන්තලේ අනුඛණ්ඩයට අනුයුක්තව ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ශ්‍රී ලංකාද්වීපයේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් දිවිපිදූ 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායට අයත් අභීත රණවිරුවන් සිහිකරනු වස් ඉදිකරනු ලැබූ රණවිරු ස්මාරකයක් 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 19 වන දින එම කඳවුරු පරිශ්‍රයේදී නිරාවරණය කෙරිණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ බලකාධිපති ගේ මාර්ගෝපදේශකත්වය මත එම අනුඛණ්ඩයේ නිලධාරී අණදෙන මේජර් ජීඩබ්ලිව්ඊඑල් සේනාධීර ගේ අධීක්ෂණයෙන් යුතුව මෙම ස්මාරකය ඉදිකිරීම සඳහා එම කඳවුරේ සෙබළුන්ගේ ශ්‍රම දායකත්වය හිමිවූහ.

# ඉගෙනුමට දිරියක්






කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කිලි/වලෙයිපාඩු රෝමානු කතෝලික දමිළ මිශ්‍ර පාසලේ ඉගෙනුම ලබන ළමුන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් 2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ භටපිරිස් විසින් එම විද්‍යාලයේ ළමුන් 100 දෙනකු වෙත 2022 වර්ෂයේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාසල් උපකරණ ලබාදීමේ වැඩසටහනක් දියත් කරනු ලැබූහ. මෙම අවස්ථාවට 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී සහ හැටන් නැෂනල් බැංකු ශාඛාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී දමිත් පල්ලෙවත්ත මහතා ප්‍රධානත්වය දැරූහ. 663 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්‍ෂණය යටතේ සිදුකළ මෙම කටයුත්තට හැටන් නැෂනල් බැංකුව මූල්‍ය දායකත්වය සැපයීය.

# ජන දිවියට සත්කාරයක්





573 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 9 වන විජයබාහු පාබල රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් භාරතීපුරම් ගම්මානයේ ජීවත්වන අඩු ආදායම්ලාභී දිළිඳු පවුල් 32 ක් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 31 වන දින භාරතීපුරම් ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 573 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ ශාන්ත තෙරේසා දේවස්ථානයේ ජෝසුදාසන් පියතුමන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# දෙපයට සවියක්ව



යාපනය සෙල්වපුරම්, යෝගපුරම් හා කෝපායි ගම්මානවල අධ්‍යාපනය හදාරනු ලබන සිසු දරු දැරියන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමට රැකුලක් වෙමින් එම දරු දැරියන් හට පාවහන් පරිත්‍යාග කිරීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 25 වන දින එම පාබල සේනාංක මූලස්ථානයේදී පැවැත්විණ. 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීම මත සිදුකළ මෙම සත්කාරයට මල්ලිකා හේමචන්ද්‍ර ජුවලර්ස් සහ කර්නල් ශිරන්ත මිල්ලගල යන නිලධාරීන්ගේ මූල්‍ය දායකත්වය හිමිවූහ.



# ලොකු (පොඩි) අක්කා

මගේ මතකයේ හැටියට ඒ අපි *LTTE* ය හා කෙරුණු යුද්ධයේ අවසන් සතියයි. ඒ වන විට *LTTE* සංවිධානයෙහි ඉතිරිව සිටි සටන්කරුවන් වෙල්ලමුල්ලිවයික්කාල් හි කලපුව ආශ්‍රිත ඉතා කුඩා බිම් කඩකට සීමා කරලීමට අප හමුදාවෝ සමත් ව සිටියහ. යුද ජයග්‍රහණය පේන මානයේ තිබූ නිසා අපගේ චිත්ත ධෛර්ය තිබුණේ ඉතා ඉහළ මට්ටමකය. දශක තුනක් පුරා රටට සාපයක්ව තිබූ බෙදුම්වාදී යුද්ධය අපේ ජීවිත කාලය තුළදීම නිම කර සතුටින් ගම් රටවල් බලා යාම සෑම සෙබළකුගේම එවකට තිබූ ඒකායන ප්‍රාර්ථනාව විය.

වන්නි මානුෂීය සටන සඳහාම අලුතින් නඟා සිටුවන ලද මා අණ දුන් 17 වන ගැමුණු හේවා බලඇණිය (මම එහි ප්‍රථම අණ දෙන නිලධාරියා වීමි). ඒ වන විට වෙල්ලන්කුලම්, පූනරින්, පරන්තන් හරහා වෙල්ලමුල්ලිවයික්කාල් දක්වා රටේ බටහිර වෙරළේ සිට නැගෙනහිර වෙරළට නව බලඇණියක් ලෙස ඉතා දුෂ්කර වූත් වෙහෙසකර වූත් ගමනක් පැමිණ තිබුණි. මේ ගමනේදී දිවි පිදූ හා තුවාල වූ මාගේ නිලධාරීන් සහ සෙබළුන් බොහෝ වූහ.

වෙල්ලමුල්ලිවයික්කාල් වලදී ආරක්ෂක හමුදා පාලන ප්‍රදේශයට නන්දිකඩාල් කලපුව හරහා මුලතිවු සහ අවට පෙදෙස් හි සිට *LTTE* සංවිධානය මිනිස් පලිහක් ලෙස යොදාගෙන සිටි අවතැන් වූ සාමාන්‍ය වැසියන්ගේ (*LTTE*) අණ නොතකා පැමිණීම මේ වන විට වැඩිවී තිබූ අතර, *LTTE* සාමාජිකයින්ද සාමාන්‍ය වැසියන් ව මුවාවී අප වෙත කරන පහරදීම් ද වැඩිකොට තිබුණි. දැඩි දුෂ්කරතා මධ්‍යයේ වුවද එලෙස *LTTE* ග්‍රහණයේ සිට පැමිණෙන සාමාන්‍ය වැසියන් ගේ ජීවිත ආරක්ෂා කළ යුතු වූ හෙයින් බලඇණි අණදෙන නිලධාරීන් වූ අපගේ වගකීම ඉතා ඉහළ විය. මේ වන විට බිත්තියටම හේත්තු වී සිටි බඹු සටන්කරුවන් අසරණ ව සිටි සිවිල් වැසියන් ගේ ජීවිත ද නොතකා ඉතා බාල යුද උපක්‍රම භාවිත කරමින් අප වෙත ප්‍රහාර එල්ල කරන්නට විය. එසේ වුවද, ප්‍රහාර මධ්‍යයේ අවතැන් වූවන් ලෙස අප වෙත පැමිණෙන දහස් ගණනක් වූ සිවිල් වැසියන් නිරුපද්‍රිතව බේරාගන්නට අපි කටයුතු කළෙමු. *LTTE* ග්‍රහණයෙන් මිදී පලා එන සිවිල් වැසියන්වද ප්‍රහාර එල්ල කිරීමට තරම් *LTTE* ය මේ වන විට අමානුෂික වී තිබුණි.

මගේ බලඇණි පාලන ප්‍රදේශයටත් සිවිල් වැසියන් කලපුව ඔස්සේ පැමිණෙමින් තිබූ අතර, ඔවුන් කඩිනමින් අනාථ කඳවුරු වෙත යැවීමද සටන් මධ්‍යයේ වුව අප කටයුතු කළේය. කලපුව ඔස්සේ මගේ බලඇණි පාලන ප්‍රදේශයට පැමිණෙන මිනිසුන් නිරීක්ෂණය කරමින් සිටියදී හදිසියේම මාගේ ඇස ගැටුණේ වයස අවුරුදු හය හතක පමණ වන කුඩා දැරියක්, වයස අවුරුදු දෙක තුනක පමණ වන දරුවකු වඩාගෙන අප පාලන ප්‍රදේශයට එන අයුරුය. ඔවුන්ගේ වැඩිහිටියන්ද පෙනෙන්නට නොසිටියෙන් මම පැමිණි පිරිසෙන් මේ දරුවන් පිළිබඳව විමසුවෙමි. ත්‍රස්ත වෙඩි ප්‍රහාර මධ්‍යයේ පැමිණි 200 ක් පමණ වන එම පිරිසෙහි සිටි කීපදෙනෙකු එන අතරමග මඟහැරුණු බව පැවසූ ඔවුන් මේ දරුවන්ගේ දෙමාපියන් ද ත්‍රස්ත වෙඩි ප්‍රහාර මැද මඟ හැරුණු බව පැවසීය. ළදරු වයසේ සිටි මෙම කුඩා දැරිය සිය බාල සොහොයුරා කිටි කිටියේ තම ළයට තුරුළු කරගෙන සිටි අතර ඇයගේ විඩාබර බියපත් දෑස් ඇය විඳි දුක් ගැහැට පිළිබඳව දිගු කතන්දරයක් කියාපෑවාය. තවමත් තැන තැන සටන් ඇවිලෙමින් තිබූ බැවින් පැමිණි එම පිරිස්



සටන් පැවති ප්‍රදේශයට මදක් ඔබ්බෙන් පිහිටි ආරක්ෂිත ස්ථානයට යොමු කළ මම ඔවුන් රැගෙන යාමට බස් රථ පැමිණෙන තෙක් ඔවුනට ආරක්ෂාව සලසන්නැයි මාගේ සෙබළ පිරිසට නියෝග කළෙමි.

ඉතා වෙහෙසට පත්ව මෙන්ම ආහාර නොමැතිකම නිසා හාමත් ව සිටි මේ මිනිසුන්ට සිය ආහාර සලාකය ලබාදීමට තරම් මගේ සෙබළුන් ත්‍යාගශීලී වූ අතර, ඉඩ ලද විගස එම පිරිස් රඳවා සිටි ස්ථානයට ගිය මට දැකගන්නට ලැබුණේ මේ කුඩා අක්කාත් මල්ලීත් හුරතල් කරන මගේ සෙබළුන් ය. මේ වන විට කුඩා දැරියගේ බිය පහව ගොස් තිබුණද ඇය සිය බාල සොහොයුරා කිසි විටකත් තනි නොකිරීමට සහ වගකීමෙන් ඔහු බලාගත්තේ ලොකු අක්කකුගේ චරිතය රඟ දක්වමින් සහ සොයුරු පෙම පිළිබඳව කදිම දර්ශනයක් මවා පාමිනි.

දින දෙකක් පමණ අප භාරයේ සිටි මෙම පිරිස් වවුනියාවේ අනාථ කඳවුරු වෙත රැගෙන යාමට බස් රථ පැමිණි තිබූ අතර එම පිරිසට සමුදීම සඳහා එම බස් රථ අසලට ගිය මට දක්නට ලැබුණේ මගේ සෙබළුන් විසින් දෙන ලද බිස්කට් චීස් සහ චොකලට්වලින් සන්නද්ධව සිටි මේ කුඩා අක්කාත් මල්ලීත් ය. මගේ සෙබළුන්ගෙන් මනාව සංග්‍රහ ලැබුවද මේ කුඩා දැරියගේ ශෝකභරිත දෙනෙත් පවසා සිටියේ ඇගේ දෙමාපියන් පිළිබඳ දුක්බර කතාවකි. මේ සියලු දුක් කම්කටොළු උසුලා සිටින හත් හැවිරිදි කුඩා දියණිය මේ දුෂ්කර සහ අවිනිශ්චිත අවස්ථාවේ සිය බාල සොහොයුරා දැඩි වගකීමකින් සහ සොයුරු පෙමකින් රැකබලා ගත් ආකාරය පිළිබඳව මට පුදුම සිතුණි.

මේ කුඩා දැරිය එක් ඇලයකට සිය කුඩා සොහොයුරාද අනෙක් ඇලයට ඇය රැගෙන විත් තිබූ බෝනික්කාද තුරුලු කර ගනිමින් ඔවුන් රැගෙන යාමට පැමිණි බස් රථයට ගොඩවූ දසුන මට කිසිදා අමතක නොවේ. ඒ දෙස මම සහ මගේ සෙබළුන් මහත් කම්පාවෙන් බලා සිටියේ මේ පොඩ්ඩන්ට සිය දෙමාපියන් කඩිනමින් මුණ ගැසේවායි සිතින් ප්‍රර්ථනා කරමිනි.



සටහන
මේජර් ජෙනරාල් කීර්ති කෝට්ටවත්ත
(විශ්‍රාමික)

# නව මානයකින් ලොව දකින්නට වරමක්





ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් තුවාල ලබා පූර්ණ අන්ධභාවයට පත්ව ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දැනට සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් දෙදෙනකු වන බ්‍රිගේඩියර් කේඒඩීඑස්කේ ධර්මසේන ආර්ඩබ්ලිව්පී හා ලුතිනන් කර්නල් වයිඑම්එස්ඩීකේ යාපා ආර්ඩබ්ලිව්පී යූඑස්පී යන නිලධාරීන් හට *Orel IT Pvt Ltd* පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් *OrCam Read Device* යන්ත්‍ර දෙකක් ප්‍රදානය කරන ලදී.

මෙම යන්ත්‍ර ඊශ්‍රායලයෙහි නිෂ්පාදනයක් වන අතර, එහි කැමරාව සහිත කොටස සවි කරනුයේ දෘෂ්‍යාබාධිත පුද්ගලයාගේ ඇස් කණ්ණාඩියෙහිය. එම කැමරාව මඟින් කියවීමට අවශ්‍ය ඉංග්‍රීසි ලේඛණයන්හි ඡායාරූපයක් ලබාගැනීමෙන් පසුව එය ස්වයංක්‍රීයව දෘෂ්‍යාබාධිත පුද්ගලයාට ඇසෙන පරිදි කියවනු ලබයි. දැනට ඉංග්‍රීසි භාෂාව පමණක් කියවන මෙම යන්ත්‍රය ඉදිරියේදී වෙනත් භාෂාවන් සඳහාද භාවිත කිරීමට හැකිවන බවත්, ඒ තුළින් දෘෂ්‍යාබාධිත පුද්ගලයන් නව මානයකට රැගෙන යාමට හැකිවනු ඇතැයි එම ආයතනය ප්‍රකාශ කරයි.

පසුගිය දෙසැම්බර් මස 29 වන දින පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ දේශන ශාලාවේදී අදාළ උපකරණ පිරිනැමීමේ අවස්ථාව සඳහා පුනරුත්තාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් අයිඑච්එම්ටීඑච් සේනාරත්න යූඑස්පී, නියෝජ්‍ය පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඩීඒජී සේනාධීර යූඑස්පී හා රණවිරු සම්පත් කේන්ද්‍රයේ නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් එස්පීකේ කුරුගම යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය සහභාගී වූහ.

# හිසට සෙවණක්



12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ 122 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් පීකේඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ කතරගම, වැඩසිටිකන්ද පන්සල පාර, ධීවර ගම්මානයේ පදිංචි ජයශාන්ත ප්‍රේමකුමාර යන අයවෙන් වෙනුවෙන් ඉදිකළ නව නිවස පසුගියදා භාරදෙන ලදී. කතරගම දේවාලයේ ධන පරිත්‍යාගයෙන් යුතුව මෙම නිවස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය 23 වන ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් ලබාදුන්හ.

# ජන දිවියට සවියක් වෙමින්



ආරක්ෂක සේනා (වන්නි) බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල ඉගෙනුම ලබන පාසල් සිසු සිසුවියන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම හා ජාතීන් අතර සංහිඳියාව වර්ධනය කිරීමේ අරමුණින් විනයාගපුරම්, රජයේ දමිළ මිශ්‍ර පාසලේ ප්‍රාථමික අංශයේ සිසු සිසුවියන් 53 දෙනකු වෙත පාසල් උපකරණ බෙදාදීමේ උත්සවයක් ඉකුත් දෙසැම්බර් 20 වන දින එම විද්‍යාලයේදී සිදුකෙරිණ. 10 වන ශ්‍රී ලංකා පාබල හමුදාව මැදිහත්ව සිදුකළ මෙම සත්කාරය සඳහා ප්‍රධාන මූල්‍ය අනුග්‍රහය එරංග ජයකොඩි හා මූන්සා මුෂ්තාක් යන මහත්ම මහත්මීන් විසින් දරනු ලැබූහ. මෙම පරිත්‍යාග අතරට බෑග්, සපත්තු, මේස්, වතුර බෝතල් හා කෑම පෙට්ටි ඇතුළත් විය. එමෙන්ම එක් සිසුවකුට ප්‍රදානය කළ පාසල් උපකරණ කට්ටලයක් රුපියල් 4500.00 ක වටිනාකමින් යුතු වූ අතර, මේ සඳහා වැයවූ මුළු වටිනාකම රුපියල් 238,500.00 ක් විය. 65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජී සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ 652 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඒයූඑස් වනසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ උපදෙස් පරිදි 10 වන ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් මෙම කටයුත්ත සංවිධානය කරන ලදී.



15(සෙව) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බල ප්‍රදේශයේ ජීවත්වන විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයන් රැසකට සහන සැලසීමේ අරමුණින් වූ වෛද්‍ය සායනයක් පසුගිය දෙසැම්බර් 19 වන දින නවයියාකුලම් දමිළ මිශ්‍ර විදුහල් පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී දෘෂ්‍යාබාධිත පුද්ගලයින් 50 දෙනකු සඳහා රුපියල් 40000.00 ක් වටිනා ඇස් කණ්ණාඩි ලබාදීම, දසදෙනකු සඳහා රුපියල් 50000.00 ක් වටිනා කෘත්‍රිම පාද ලබාදීම සහ ගැබිනි මාතාවන් 25 දෙනකු සඳහා රුපියල් 625000.00 ක් වටිනා පෝෂණ මළු සහ අත්‍යාවශ්‍ය උපකරණ ලබාදීම සිදුවිය.

"82 අපි" සමූහයේ අනුග්‍රාහකත්වයෙන් *Vision Care* ආයතනය හා *Center for handicaps* ආයතනය එක්ව මේ සඳහා දායකත්වය ලබාදෙන ලදී. 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූයූකේඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ මගපෙන්වීම මත 562 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණයෙන් යුතුව ක්‍රියාත්මක කෙරුණු මෙම වැඩසටහන 15 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අණදෙන නිලධාරී මේජර් ආර්එම්ජේබී රාජපක්ෂ ඇතුළු එම ඒකක නිලධාරීන් සහ සෙනින් විසින් සංවිධානය කරනු ලැබූහ.

# ENGLISH

## Vision...

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මඟින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු

### There is no need to

යම්කිසි කාර්යයක් කිරීම සබැඳිව එය එසේ කිරීමට "අවශ්‍යතාවක් නැ" යන අර්ථය ප්‍රකාශවන පරිදි වාක්‍ය නිර්මාණය කිරීම සඳහා මෙම වාක්‍ය රටාව භාවිතා වේ.

***Fomular*** :- සූත්‍රය

> **There is no need to + Verb (Infinitive) + Object + Rest.**
> දෙයාර් ඊස් නෝ නීඩ් ටු + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
> අවශ්‍යතාවක් නැ + ක්‍රියා පදය (මූල ස්වරූපය) + කර්මය + ඉතිරිය.

***Ex /*** *උදා* :-

1. There is no need to meet her.
   දෙයාර් ඊස් නෝ නීඩ් ටු මීට් හර්.
   ඇයව හමුවීමේ අවශ්‍යතාවක් නැහැ.

2. There is no need to tell them about this incident.
   දෙයාර් ඊස් නෝ නීඩ් ටු ටෙල් දෙම් ඩිස් ඉන්සිඩන්ට්.
   ඔවුන්ට මේ සිදුවීම සම්බන්ධව කීමට අවශ්‍යතාවක් නැහැ.

3. There is no need to discuss again.
   දෙයාර් ඊස් නෝ නීඩ් ටු ඩිස්කස් අගෙයින්.
   නැවත සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවක් නැහැ.

***Nota Bene /*** සැ:යු :-
ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී,

**There is no need to** *:-* අවශ්‍යතාවක් නැහැ යන අර්ථය ගම්‍ය වන මෙම වාක්‍ය කණ්ඩය කිසිදු වෙනසකට භාජනය නොකොට වාක්‍යයේ භාවිතා වේ.

**Verb** *:-* ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී ***(ing)*** ක්‍රියා පදයක් ලෙස භාවිතා කළ යුතුය.

**Object** :- කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම ලබන පුද්ගලයකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිත වේ.

**Rest** :- ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

There is no need to call them.
දෙයාර් ඊස් නෝ නීඩ් ටු කෝල් දෙම්.
ඔවුන්ව අමතන්නට අවශ්‍යතාවක් නැහැ.

> **Analysis of the sentence formation** - **වාක්‍ය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.**
>
> **There is no need to + Verb (Infinitive) + Object + Rest.**
> දෙයාර් ඊස් නෝ නීඩ් ටු + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
> අවශ්‍යතාවක් නැ + ක්‍රියා පදය (මූල ස්වරූපය) + කර්මය + ඉතිරිය.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා " රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලංකාපාබළසේනා
ජනමාධ්‍ය අංශ - යුහමූ
www.englishvision.lk




## රැඟුමක අවසන...

වැරෙන් තදකර
දුබල හදවත
ගිලගනී නුඹ
මා සතු අවසන් සුසුම් පොද
හැරදමා දොරගුළු
සෙවණැලි නිදන ලෝකයට
කැඳවයි ඉක්මිතිව
අතින් සන් කර වර මෙහෙයි නොපමාව
පියාගනිමි දෑස
සැලෙන දෙතොල් තදකර
සිහි කළෙමි අතීතය සසර
තර කර වැළඳ
හැරදමා නොයන ලෙස
කඳුළු වගුරා හඬන
සුවහසක් ප්‍රියයන්ට
බෑ කියන්නට බැරිව
අසරණය අද මම
සටන් කර දිනාගත හැකි
ජයක් නැත එරෙහිව ඔහුට
දුර්වලය ගත සවිය
කළුවරය සිත ඇස
දොර හරිමි සිරුවට
හැරයමි රඟ මඬල
එනු මැනවි මරණය
රැගෙන යනු මා නොපමාව

සෙ/653626
**කෝප්‍රල් වීරසිංහ ජීකේටීඑන්එන්**
4 ශ්‍රීලසුරෙජි

## අම්මා...

මේ මහා සංසාරයේ
පින් හුගාක් නොකලත් අම්මේ
මා හදාවඩා නුවණැස පෑදූ
පිනම ඇති ඔබට
මේ මහා සංසාරයෙන්
එතෙර වෙන්න..

සෙ/2ඩී03197
**ලා/කෝ දයාරත්න ඩීජීටී**
2 ශ්‍රීලපෙහ

## උරුම ආදරය...

ඝෝර රගසින් ඇවිත් සිතට
දුන්නු ආදරේ ගතට
නැගෙන විටදී මගේ සිතට
ආදරේ හිතුනා ඔබට

ආත්ම ගණනක් මෙලෙසේ
පැමිණියෙ මා පුරුදු ලෙසේ
දැනුන ආදරේ කෙලෙසේ
කියමි මෙමා අද මෙලෙසේ

පුංචි හදට තුරුළු වෙලා
සිටියා අපි වසන් වෙලා
ඒ සෙනෙහස උරුම වෙලා
සිටිමි මෙමා උමතු වෙලා

ඔබ මට ආදරෙ නේදෝ
නෑ කියන්නෙ නෑ නේදෝ
එන්නද මං දැන් හාදෝ
මගේම වෙනවා නේදෝ

සෙ/කිහු101056
**කෝප්‍රල් සරත් කුමාර එච්එම්ජී**
යුද්ධ හමුදා මූලස්ථානය

## තාත්තා...

පුරා සඳෙන් ඝණ කළුවර
එළිය කෙරූ
මිරිවැඩි සගල මල් පෙතිමෙන්
පහස කෙරූ
දැනේ නුඹ නැති අඩුව
නුඹ මෙලොවින් ගිය දිනෙන් පසු
සැමදා නුඹ පායන්න මගෙ
ලෝකයට මතු

සෙ/328402
**ලා/කෝ චන්ද්‍රසේකර එල්එස්**
12 ශ්‍රීලපෙහ

## කඳුළ

සතුට හා දුක
එකට එක්කර
හදේ පිපෙන
සිතක් හඬවන
සිතක් සනසන
නෙතු අග රැඳුණ
පුංචි බිංදුව

**මේජර් කේකේජීඑස් කුමාර**
ශ්‍රීලංජාආබමු

## තාත්තා...

ඉස්සර වගේ මාව
ගොඩක් ආදරයෙන්
රැක බලාගෙන
මගේ ළඟින් ඉඳන් මට
සැලකුවා නම්..
මං කවදාවත් ඔහොම
දඩුවම් කරන්නෑ ඔයාට..
මාත් ආසයි ඔයා වගේ සතුටින්
ලස්සනට ජීවත් වෙන්න
දැන් ඔයාට හරියට නිදහසේ
හුස්ම ගන්නත් නෑ
හරියට කෑමක් බීමක් ගන්න නෑ
ගමනක් බිමනක් යන්න
විනෝද වෙන්න
නිදහස නෑ නේද
මාව ආරක්ෂා කරගන්න
සොබාදහම මම..

සෙ/6ඉ/00496
**කෝප්‍රල් ඒකනායක ජීඑම්ආර්සී**
යුද්ධ හමුදා මූලස්ථානය

## මගේ සකිසඳ...

බියෙන් පීඩිත රුදුරු සමයක
තැබුවෙ පියවර නවමු මඟකට
අතරමඟදී හැවතු රියසක
සිරකළා සොල්දාදු දෙනෙතක..

සහය දී රට රකින සැමහට
ඉදිරියට පියමනින සැනෙකට
කරුණු විමසූ නුඹේ නෙතු මට
රහස කිව්වේ නොකියූ හැඟුමක

එදත් අද මෙන් නුඹේ නිලයට
හිස නැමුවෙමි සකිය ගරු කොට
නුඹේ දෙනෙතේ තිබුණු කැල්මට
අතරමං විය එකම මොහොතට

යළිත් දිනයක නුඹව දැකුමට
පෙරුම් පුරනෙමි එදා සිට මම
තිහක් ගෙවුණත් වසර හෙමිහිට
අදත් සිහිවෙයි මගේ සකිසඳ

**පීඑල්අයි සංකල්පනී**
වාරිමාර්ග නිල නිවාස
සිරිනිවාස මාවත,
කළුතර උතුර

# දත් ගැලවීම...

සිනමාහලක රැකියාවක් කළ සේවකයකු දිරාගිය දතක් ගලවා ගැනීම සඳහා දන්ත වෛද්‍යවරයකු හමුවට ගියේය. නරක් වූ දත සොයා වෛද්‍යවරයා ඔහුගේ මුඛය පිරික්සන්නට විය.

"නෑ නෑ දොස්තර මහත්තය ඉස්සරහ පේළියෙ නෙවෙයි, ඔය බැල්කනිය කෙළින්ම තියෙන දතයි ගලවන්ඩ ඕනෙ" යි සේවකයා පහදා දුන්නේය.



# රවුම් ගැහිල්ල...

සිය දියණිය තරුණයකු සමග රවුම් ගසන බවට ඔහු වෙත ආරංචි ගලා ආවේය. ඉවසිය නොහැකි තරමට ඔහුගේ කෝපය ඉහළ නැංගේය.

"රවුම් ගහල විපතක් කරගෙන එන්නෙ නැතිව බැන්දාම ඉවරයිනෙ" දිනක් ඔහු දියණියට කාර්යාලයෙන් ආ විගස කීය. රවුම් ගැහිල්ල අදින් ඉවරයි. අපි බැන්දා. මං රස්සාවෙන් අස් වුණා. එයා හෙට මෙහෙ පදිංචියට ඒවි.
ඔහු ඈතට යොමුකළ නෙතින් කල්පනාකාරීව සිටිනු දක්නා ලදී.



# දඩය...

අලුතින් පාසලට ඇතුළු වූ සිසුන්ට පාසල් නේවාසිකාගාරයේ නිදන ශාලාව සම්බන්ධ නීති පිළබඳව පැහැදිලි කරමින් විදුහල්පති මෙසේ කියා සිටියේය.
පුරුෂ නිදන ශාලාවෙහි කාන්තාවක් සිට හෝ කාන්තා නිදන ශාලාවේ පුරුෂයෙක් සිට අසුවුවහොත් පළමු වතාවට රුපියල් 200 ක දඩයකුත්, දෙවන වතාවට අසුවුවහොත් රුපියල් 500 ක දඩයකුත්, තෙවන වතාවට අසුවුවහොත් රුපියල් 1000 ක දඩයකුත් ගෙවිය යුතුයි. මේ සම්බන්ධව ඔබලාට යම් ප්‍රශ්නයක් තිබේනම් අසන්නට පුළුවනි.
කසුන් නැගිට —මුළු වාරයටම දඩය කීයද සර්....?"



# විභාගය...

**පුතා** - අම්මේ... මං විභාගෙට ලකුණු 100 යි...
**අම්මා** - මගෙ හොඳ පුතා... මොන සබ්ජෙක්ට් එකටද...?
**පුතා** - ගණන් වලට 30 යි, සිංහල වලට 45 යි, ඉතිහාසෙට 25 යි...



# හරි වැරදි...

**සිල්වා නෝනා** - මායි මගේ මහත්තයයි බැඳල අවුරුදු 5 ක් වෙනවා. ඒත් කවදාවත් රණ්ඩු වෙලා නැහැ.

**පෙරේරා නෝනා** - ඒ කොහොමද එහෙම ඉන්නෙ...?

**සිල්වා නෝනා** - අපි අතර වාදයක් උණොත් මම හරි නම් එයා ඒක පිළි අරගෙන මගෙන් සමාව ඉල්ලනවා...

**පෙරේරා නෝනා** - හොඳයි... අපි හිතමු මිස්ටර් සිල්වා හරිනම් ඔයා මොකද කරන්නෙ...?

**සිල්වා නෝනා** - තවම එහෙම දෙයක් වුණේ නැහැනෙ...



# ළමයිගෙ තාත්තා...

ධනවත් නිවසක ස්වාමි දුව නිවසේ වැඩකාරියගෙන් මෙසේ ඇසුවාය.
**ස්වාමි දුව** - ඈ බං ඇසිලින්... මම මගේ මහත්තයට නම කියල කතා කරනවා එහෙම නැත්නං ඩාලිං කියලා කතා කරනවා... උඹට මොකද බැරි උඹේ මිනිහටත් එහෙම කියල කතා කරන්න. උඹ කොයි වෙලෙත් කතා කරන්නෙ ළමයින්ගේ තාත්ත කියලනෙ... ඇයි ඒ...?
**වැඩකාරිය** - මම එකත් එකටම දන්නවා නෝනා ඒ මගේ ළමයින්ගේ තාත්තා කියලා...

## වෘත්තීය දිවියේ අනේකවිධ කඩ ඉම් පසු කොට
## සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට
## දිරිය, විරිය, රැකවරණය ලැබේවායි
## "රණවිරුවා" මෙසේ සුබ පැතුම් එක්කරයි.



යුධෝපකරණ සේවා
අධ්‍යක්ෂ ලෙස
**බ්‍රිගේඩියර්**
**පීකේඅයි විතානච්චි ඒටීබී**
**2022 ජනවාරි මස 20 දින සිට**



ගැමුණු හේවා බලකායේ
මධ්‍යස්ථාන
සේනාවිධායක ලෙස
**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්බීජේකේ විමලරත්න**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2021 දෙසැම්බර් මස 24 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර)
බ්‍රිගේඩියර් (සෙවි)
සම්බන්ධීකරණ ලෙස
**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්ආර්ඩබ්ලිව්එම්-**
**එස්ආර්එම්බී වීරකෝන්**
**2022 ජනවාරි මස 12 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර) කර්නල්
(සම්බන්ධීකරණ) ලෙස
**කර්නල්**
**ඩීපී වෙලගෙදර ආර්එස්පී**
**යූඑස්පී පීඑස්සී අයිජී**
**2021 දෙසැම්බර් මස 18 දින සිට**



56 වන පාබල සේනාංකයේ
කර්නල් ප්‍රමාණි ලෙස
**කර්නල්**
**කේපීපී කරුණානායක**
**2021 දෙසැම්බර් මස 16 දින සිට**



11 වන පාබල සේනාංකයේ
කර්නල් ප්‍රමාණි ලෙස
**කර්නල්**
**කේපීඑල් අමුණුපුරේ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී**
**2022 ජනවාරි මස 15 දින සිට**




ආරක්ෂක සේනා
මූලස්ථානය (වන්නි) කර්නල්
සම්බන්ධීකරණ ලෙස
**කර්නල්**
**ඩබ්ලිව්කේඑස්පීඑම්ආර්ඊබී**
**දොඩම්වල පීඑස්සී**
**2021 දෙසැම්බර් මස 20 දින සිට**



56 වන පාබල සේනාංකයේ
කර්නල් සම්බන්ධීකරණ ලෙස
**කර්නල්**
**ඩීඩීපීඑ ජයවර්ධන යූඑස්පී පීඑස්සී**
**2021 දෙසැම්බර් මස 14 දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බලසේනාවේ
කර්නල් (පුහුණු) ලෙස
**කර්නල්**
**කේටීඑච් හරිප්‍රිය ආර්එස්පී**
**2021 දෙසැම්බර් මස 23 දින සිට**



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක
බලමුළුවේ නියෝජ්‍ය
මධ්‍යස්ථාන
සේනාවිධායක ලෙස
**කර්නල්**
**එන්එච්ජේඑම් නවරත්න**
**2021 දෙසැම්බර් මස 17 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) ප්‍රධාන සිවිල්
සම්බන්ධීකරණ නිලධාරී ලෙස
**කර්නල්**
**ඩබ්ලිව්ඩීයූ වනිගසූරිය**
**2021 දෙසැම්බර් මස 12 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(මුලතිව්) සිවිල් සම්බන්ධීකරණ
නිලධාරී ලෙස
**කර්නල්**
**ඩබ්ලිව්පීජේකේ දිසානායක**
**2021 දෙසැම්බර් මස 17 දින සිට**



යුද්ධ හමුදා සුපවේදී බලඇණියේ අණදෙන නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**ඩබ්ලිව්ඩබ්ලිව්එම්ඒයියු බණ්ඩාර යූඑස්පී එල්එස්සී**
**2021 නොවැම්බර් මස 11 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) මානි 1 (හකාස) ලෙස
**ලුතිනන් කර්නල්**
**සීඑස් දේමුණි**
**2022 ජනවාරි මස 07 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) මානි 1 මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ලෙස
**ලුතිනන් කර්නල්**
**ඩබ්ලිව්පී හේමපිත් ආර්එස්පී**
**2022 ජනවාරි මස 18 දින සිට**



56 වන පාබල සේනාංකයේ ප්‍රමානි 1 (ක්‍රියා) ලෙස
**ලුතිනන් කර්නල්**
**ඩීඑම්එම්බී දිසානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**2021 දෙසැම්බර් මස 10 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**ඒපීඑස්ඒ කුමාර**
**2021 දෙසැම්බර් මස 21 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**පීඩබ්ලිව්එස්බී අබේතිලක**
**2021 දෙසැම්බර් මස 18 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ෂ (ක්‍රියාන්විත) ලෙස
**ලුතිනන් කර්නල්**
**එල්ඩබ්ලිව්බී රදීමාලියද්ද යූඑස්පී අයිජී**
**2021 දෙසැම්බර් මස 14 දින සිට**



23 වන බලඇණිය ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**කේඒඑස් ගුණවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**2022 ජනවාරි මස 10 දින සිට**



18 වන ගැමුණු හේවා බලකායේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**ආර්එම් පතිරාජ ආර්එස්පී යූඑස්පී**
**2021 දෙසැම්බර් මස 28 දින සිට**



7(සේවා) ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**එච්එම්එස්එස්බී කරුණාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**2022 ජනවාරි මස 01 දින සිට**



9(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**අයිඑම්පීඑන් ජයතිලක**
**2021 දෙසැම්බර් මස 28 දින සිට**



2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**බීඑම්ඒයි බාලසූරිය**
**2021 නොවැම්බර් මස 15 දින සිට**

# හරිත කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කරමින්





ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ හරිත කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙවතු වගාව දිරිමත් කිරීමේ අරමුණින් "කාබනික පොහොර භාවිතයෙන් ආදර්ශ ගෙවත්ත" යන මැයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 13 වන දින වඩමාරච්චි කලාප අධ්‍යාපන කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණි. පාසල් 12 ක සිසු සිසුවියන්ගේ සහභාගිත්වයෙන් පැවති මෙම අවස්ථාව සඳහා 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී, 551, 552 හා 553 වන පාබල බලසේනාධිපතිවරු ඇතුළු නිලධාරීන් හා රාජ්‍ය නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.


## රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම් - 11 ඉසේරෙ
සෙ/754676 ලාන්ස් කෝප්‍රල් ලක්තිළිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**
රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය, කොළඹ

**ඊමේල්**
dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**
011 2993076

**යුහ දිගුව**
51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය






**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
එච්ඩබ්ලිව්පී අමරපාල
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ඩීඑම්එම් දිසානායක ආර්ඩබ්ලිව්පී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
ටීවී සුජිත් චමින්ද



**සහය සංස්කාරක**

මේජර්
පීඩබ්ලිව්එස්ඩබ්ලිව් විමලරත්න

# හදිසි නිරීක්ෂණ සංචාරයක්







ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් ජනවාරි 14 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ හදිසි සංචාරයක නිරතවිය. එහිදී කඳවුරු පරිශ්‍රයේ මුළුතැන්ගෙයි ස්ථාන කිහිපයක් සහ කාන්තා සෙබළියන් සඳහා වන භෝජනාගාර කිහිපයක් ඔහුගේ නිරීක්ෂණයට බඳුන් විය.

පනාගොඩ යුද්ධ හමුදා ජනපදය වෙත යුද්ධ හමුදාධිපති ගේ පැමිණීම පිළිබඳ දැනුවත් වීමත් සමඟ එහි ප්‍රධාන සංඥා නිලධාරි සහ ශ්‍රී ලංකා සංඥා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයූ ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනකු ද එම අවස්ථාවේ යුද්ධ හමුදාධිපති සමඟින් සම්බන්ධ වූහ.

සිය සංචාරයේ දී ආහාර පිළියෙළ කිරීම සඳහා භාවිතා කරන උපකරණ පිළිබඳ නිරීක්ෂණය කළ යුද්ධ හමුදාධිපති අනතුරුව, සූපවේදීන් සහ සෙසුනිලයන් සමඟ අදහස් හුවමාරු කරගනිමින් ආහාර ප්‍රභේදවල ප්‍රමිතිය සහ ඒවායේ අඩංගු කැලරි ප්‍රමාණය ආදි කරුණු පිළිබඳවද විමසීය. පසුව, දිවා ආහාර වේලාවේදී භෝජනාගාරයේ ද සංචාරය කරමින් කාන්තා සෙබළියන් සමඟ ඔවුන්ගේ ආහාර වේල පිළිබඳවද සොයාබලන ලදී. මෙම සංචාරය අතරතුර, යුද්ධ හමුදාධිපති එම පරිශ්‍රයේ පිහිටි යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පාලනය කරනු ලබන ගොවිපළ නිෂ්පාදන අලෙවිසැලෙහි ද සංචාරය කළේය.

ඉන් අනතුරුව, යුද්ධ හමුදා ජනපදය තුළ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ද සංචාරය කරමින් සෙසුනිල භෝජනාගාරයන්හි කටයුතුද නිරීක්ෂණය කළේය.



# රණබිමේ මතක

## හිමිදිරියේ ඇරඹුම...

හැමදාම උදේට ඉර පායද්දී මුළු ලෝකයම අලුත් වෙනව. නමුත් යුද ගැටුම් පැවති ගෙවුණු දශක තුන තුළ ඒ වෙනස යුද බිමට දැනුනෙ නැහැ. හිමිදිරියේ ඉඳන් අවි මානගෙන පෙරමඟ දෑස් දල්වාගෙන ඉද්දී දවස ගෙවුනෙ නොදැනීම. බලාපොරොත්තු ප්‍රාර්ථනා පොදි බැඳගත්ත අහිංසක මිනිස්සුන්ගේ අනාගත හීන හැබෑ කර දෙන්න මුළු රටටම සාමය හා නිදහස උදාකරදෙන එක විතරමයි රණවිරුවො හිතුවෙ. අන්තිමට ඔවුන් ඒ දේ කළා. වර්තමානයේ ඉඳන් ආපසු හැරිල බලනකොට ඒ උත්තම මෙහෙවරට දායක වුණු හැම රණවිරුවෙකුටම දැනෙන අප්‍රමාණ සතුට හා ආඩම්බරය වචනවලින් විස්තර කරන්න බැරි තරම්.



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යයන මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.